# වාර්ෂික වාර්තාව 2015

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ
මධ්‍යම උපදේශක කාර්යාංශය



# පටුන


- අප සම්බන්ධයෙන් 1
- සභාපතිවරයාගේ පණිවුඩය 3
- සාමාන්‍යාධිකාරිවරයාගේ පණිඩුය 4
- මූල්‍යමය විශේෂතා 5
- අධ්‍යක්ෂ මණ්ඩලය 6
- මඉළකා හි කළමනාකරණ කණ්ඩායම 8
- අධක්ෂවරයාගේ වාර්තාව 9
- විගණන  කමිටු වාර්තාව 11
- ඒකාබද්ධ තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති 13
- මූල්‍ය ප්‍රකාශන
  - විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 24
  - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 25
  - මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය 26
  - සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශනය 27
  - මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 29
- විගණකාධිපතිවරයාගේ වාර්තාව 36
- විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශන 46
- වර්ෂයේ කාර්ය සාධනය 50
- මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම - මඉසේස 61

# ඉංජිනේරු ශිල්පයෙන් විශිෂ්ට ශ්‍රී ලංකාවක් කරා...

ජාතික ඉංජිනේරුමය උපදේශකත්වය හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය සඳහා ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි පිළිගත් ව්‍යාපාර නිරූපකය ලෙස සහ රජයට අයත්, වාණිජමය වශයෙන් සාර්ථක, ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස මඉඋකා වසර 42ක දීර්ඝ ශක්තිමත් ඉංජිනේරු කාර්ය සාධනයන් සපුරාලයි. දැවැන්ත බහුකාර්ය මහවැලි සංවර්ධන යටිතල ව්‍යුහ ව්‍යාපෘතිය තුළ අපගේ ඉංජිනේරුමය මූලධර්ම මනාව බැඳී ඇති අතර එතැන් සිට ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි විවිධ වූ සමාජ හා ආර්ථික යටිතල පහසුකම් රාශියක් සංවර්ධනය කිරීම සඳහා ඉංජිනේරුමය විශේෂඥතාව එක් කිරීමට පුළුල් සහ වැඩි දියුණු කර ඇත.

අපගේ ඒකාබද්ධතා ශක්තිය සහ හැකියාවන් මඟින් වේලි, උමං මාර්ග, ජලවිදුලි ඉංජිනේරු (ශ්‍රී ලංකාව/නැගෙනහිර අප්‍රිකාව), වාරිමාර්ග, ජල සම්පාදන/සනීපාරක්ෂක සහ පාරිසරික ඉංජිනේරු, මහාමාර්ග, පාලම්, දුම්රිය මාර්ග, ගුවන් තොටුපල,තට්ටු ගොඩනැගිලි, ගොඩනැගිලි සහ නාගරික යටිතල පහසුකම්, විශ්වවිද්‍යාල, රසායනාගාර, සෞඛ්‍ය ආරක්ෂණය, වෙරළ සහ සමුද්‍රීය, ආරක්ෂක යටිතල පහසුකම්, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල ඉදිකිරීම ආවරණය වේ. පාරිසරික අධ්‍යයන, ස්වාභාවික සම්පත් කළමනාකරණය, නැවත පදිංචි කිරීමේ සමාජ ආර්ථික තත්ත්වය, ප්‍රජා සංවර්ධන, තොරතුරු සන්නිවේදන ජාල ආදිය අපගේ විශේෂඥතා පරාසය මඟින් තවදුරටත් ආවරණය වේ. ඇත්ත වශයෙන්ම එක වහලක් යටින් සියලූ ඉංජිනේරුමය සැලසුම්, උපෙද්ශන සහ ඉදිකිරීම් අවශ්‍යතා ඉටුකර ගත හැකි ආයතනය අප වේ.

පශ්චාත් ගැටුම් යුගයේ වෙනස්කම් හා අප ජනතාවගේ අපේක්ෂාවන් උදෙසා අප, අපගේ ජාතික වගකීම් අඛණ්ඩව ඉටු කර ඇත. අපගේ ස්වර්ණමය ජුබිලිය අසල සිටියදී අප ක්ෂේත්‍රයේ ප්‍රබලතම ස්ථානයක රැඳී සිටී. මඉඋකා විසින් පුහුණු බහු*විෂය විශේෂඥතාවය හා නවීන ඉංජිනේරුමය හැකියාවන් සමඟින් ආකර්ශනීය පොදු හා පෞද්ගලික යටිතල ව්‍යුහ සහ උපයෝගිතා නිර්මාණය කරන අතරම පරිසරය සුරැකීමෙහි අනාගත ජාතික අභියෝගවලට මුහුණදීමට සිය ප්‍රයත්නයන් දෙගුණ කරනු ඇත.




# දැක්ම

ලෝක තත්ත්වයේ ඉංජිනේරුමය ආයතනයක් කරා

# මෙහෙවර

මිනිස් සංහතියේ සුභසිද්ධිය සඳහා සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගන්නාවූද, ඉංජිනේරු විද්‍යා, ගෘහ නිර්මාණ ශිල්ප, හා ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයන් හි නවීනතම තාක්ෂණය භාවිතා කරන්නාවූද, තම සේවාවන් සඳහා නිසි ඇගයීම් ලබමින් මැනවින් අභිප්‍රේරනයවූ කාර්ය මණ්ඩලයකින් සමන්විතවූද ජාත්‍යන්තර තලයේ ඉංජිනේරු ආයතනයක් බවට පත්වීම



මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින ක්‍රියාකාරිත්වයෙන් බහු ආයතනික, ප්‍රවේශයෙන් පුරෝගාමී සහ, ඒ සියලු දේට ඉහළින් ඉදිරියට යෑමේ අභිලාශයෙන් යුත් අභිප්‍රේරිත වෘත්තිකයන් කණ්ඩායමකින් සැදුම්ලත් අග්‍රගණ්‍ය උපදේශන ආයතනයයි.

එම අභිප්‍රේරණය අතීතයත් සමඟින් පැමිණෙන්නකි - එම අතීතය දශක දෙකකටත් වඩා පෙර සිට මෙම දිවයිනෙහි මුහුණත නොමැකෙන සලකුණු රාශියක් තැබූ අතීතයකි: එම අතීතය වර්තමාන සංවර්ධිත ලෝකය අවදි කිරීමට අසීරු වූ කාලයේ වැජඹුණු අතීතයකි.

වාසනාවකට, එම නොමැකෙන සලකුණු එම දුරාතීතයේ දක්ෂ ඉංජිනේරුමය වික්‍රමයන්- ජීවය රහිත මෙවලම් මෙන් නොව අපගේ ශරීරයෙහි දිව යන යම් දෙයක් ලෙසින්...... අපව පෝෂණය කරමින්...... සහ අපගේ ආත්මයන්ට ජීවය ලබා දෙමින් තවමත් අප සමඟ පවතී. තවද එය අප විසින් තෝරා ගෙන ඇති පුරුෂයින්ගේ සහ කාන්තාවන්ගේ අභිප්‍රේරණය වර්ධනය කරයි.

එවැනි අභිප්‍රේරණයන්ට මඉදකාහිදී අපි ජවය ලබා දෙන්නෙමු.

# සභාපතිවරයාගේ පණිවුඩය



**ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක**
B.Sc.(Eng),
PG Dip, (Const.Mgt),
PG Dip. (Port & Coastal) Norway,
MIE(SL) C.Eng.MASCE
**සභාපති**

2015 මූල්‍ය වර්ෂය සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ (මඉඋකා) වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ ගිණුම් ඉදිරිපත් කිරීමට ලැබීම මාගේ සතුටට හේතු වන අතර එය මා හට ලැබුනු ගෞරවයක් ලෙස සලකමි. සභාපතිවරයා වශයෙන් මගේ පළමු වාර්ෂික ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර වසර 35 ක් පුරා ඉංජිනේරුවෙකු ලෙස විවිධ තරාතිරම්වල අභිමානයෙන් සේවය කරන ලද ශ්‍රී ලංකාවේ මෙම ගෞරවනීය ඉංජිනේරු උපදේශක හා ඉදිකිරීම් ආයතනයේ සභාපතිවරයා ලෙස මා පත් කර ලබා දුන් ගෞරවය සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට මාගේ කෘතඥතාවය පළ කර සිටිමි. ආයතනයට විශාල ශක්තියක් සහ අනුබලයක් වූ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් ධූරයට උසස්වීම් ලැබ පිටව යන හිටපු සභාපතිවරයා වන ඉංජි. නිහාල් රූපසිංහ මහතාට අගය කිරීම සඳහාද මෙය අවස්ථාවක් කර ගනිමි.

මුහුණ දුන් සාර්ව ආර්ථික සහ වෙනත් අභියෝගයන් පිළිබඳව අවධානය යොමු කරමින් සහ අගය කළ යුතු කිර්යා සාධනයක් වාර්තා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණ කණ්ඩායම විසින් දරන ලද ප්‍රයත්නයන් සලකා බලමින් අපගේ කාර්ය සාධනය සමාලෝචනය කරමු.2015 ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව මඟින් 2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 7.0%ක නාමික අගයක පවතින බව වාර්තා කර සිටී.කෙසේවෙතත්, 2014 වර්ෂයේදී වාර්තා වූ 6.6%ක වර්ධන අනුපාතයට සාපේක්ෂව 2015 වර්ෂයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය 0.9% කින් අඩු විය. මෙම කාලපරිච්ඡේදය තුළ මහා පරිමාණයේ ව්‍යාපෘති නොමැති වීම මෙම මන්දගාමිත්වයට හේතු විය. සාමාන්‍යයෙන්,රටේ විශාල පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා මඉඋකා ප්‍රධාන උපදේශකයෙකු වන අතර, මෙම සාර්ව ආර්ථික මන්දගාමිත්වය අපගේ මූල්‍ය කාර්ය සාධනයට බලපා ඇත. 2014 වසරේදී රුපියල් බිලියන 13.4 ක් වූ අපගේ සමූහ ආදායම, 2015 වර්ෂයේදී 14.9% කින් රුපියල් බිලියන 11.4 ක් දක්වා පහත වැටී ඇත. මෙම පසුබෑම නොතකා අපගේ පරිපාලනමය, විකුණුම් හා බෙදාහැරීම් පිරිවැයවල ඵලදායී පිරිවැය කාර්යක්ෂමතාවය තුළින්ම මඉඋකා, මාර්ග හා දුම්රිය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සහ ගොඩනැගිලි ක්ෂේත්‍රයේ වර්ධන වේගය පවත්වා ගැනීමට සමත් වී ඇති අතර එමඟින් 2014 වර්ෂයේ රු.මිලියන 684.2 බදු පෙර ලාභය 2015 වර්ෂයේදී රු.මිලියන 713.6 දක්වා 4.3%කින් ඉහළ නංවා ගැනීමට සමත් වී ඇත. රජයට අයත් ව්‍යවසායක් ලෙස ලෙස අප රෙගුලාසිමය අවශ්‍යතාවයන් දැඩි ලෙස අනුමගමනය කළ යුතුය.සමුච්චිත බදු හා අනෙකුත් බදු වශයෙන් රජයට රු.මිලියන 287.4ක් ප්‍රේෂණය කර ඇත.අධ්‍යක්ෂ මණ්ඩල මඟපෙන්වීම් සමඟ වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව ඇගයීමට ලක් කරනු ලබන දැඩි පාලන හා අධීක්ෂණ යාන්ත්‍රණ ස්ථාපනය කිරීම තුළින් පරිපාලන හා ගිණුම්කරණ කටයුතු ඉහළ නැංවීම සඳහා නව ප්‍රයත්නයන් දරා ඇත.

අනාගතය දෙස බැලීමේදී, ඉංජිනේරුමය ව්‍යාපෘති සඳහා විවෘත වෙළඳපොළ තරඟකාරී ලංසුකරණය සඳහා සහභාගීවීම තුළින් මූල්‍ය වර්ධනයක් අත්පත් කර ගැනීම පිණිස වාණිජ මෙහෙයුම්වලින් කොටසක් ලබා ගැනීම සඳහා මඉඋකා පූර්ණ වශයෙන් සූදානම්ව උනන්දුවෙන් සිටී. මඉඋකා හි වාණිජමය අරමුණු සහිත ඉදිකිරීම් අංශය වන මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම (මඉසේස) වාණිජ ක්ෂේත්‍රයේ ඵලදායී ලෙස සහභාගී වීම සඳහා වෙළෙඳපොළ ස්ථානගත කර ඇත. උපදේශකත්වය ලෙස, මඉඋකා, පසුගිය වසර හතලිහක කාලය තුළ ගොඩනඟාගෙන ඇති බහුවිෂය ඉංජිනේරු කීර්තිය සමඟින් වෙළෙඳපොළ ප්‍රමුඛයා ලෙස කටයුතු කරයි.

අවසාන වශයෙන් මාගේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සිය වටිනා සහාය සහ උපදෙස් සඳහා මගේ කෘතඥතාව පළ කරමි, ඔහුගේ නායකත්වය හා කැපවීම සඳහා සාමාන්‍යාධිකාරිවරයාටත්, ඔවුන්ගේ කැපවීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයටත්, විශේෂයෙන්ම අපගේ විශිෂ්ටතම වත්කම වන අපගේ කාර්ය මණ්ඩලටත් ස්තූතිවන්ත වෙමි.

# සාමාන්‍යාධිකාරිවරයාගේ පණිවුඩය



**ඉංජි. කේ.එල්.එස්. සහබන්දු**

Bsc.Eng (Hons),
PG Dip(Hyd), MSc. (Struct.),CEng,
MICE (London),MIE (SL),
M.Cons E(SL), FSSE (SL)

**සාමාන්‍යාධිකාරි**

සමාලෝචිත වර්ෂයේදී මඉඋකා එහි අභ්‍යන්තර සහ සහ බාහිර මෙහෙයුම් පරිසරවලදී නව වෙනස්කම් සහ අභියෝගවලට මුහුණ දෙන ලදි. අපි අපේ නව සභාපතිවරයා වන ඉංජි ජී.ඩී.ඒ. පියතිලක මහතා පිළිගන්නා අතර අපගේ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ඉහළ වගකීම් භාර ගැනීම සඳහා මඉඋකා සභාපති ධූරයෙන් ඉවත්ව ගිය ඉංජි. නිහාල් රූපසිංහ මහතාට සුභ පතන්නෙමු. ජාතික ඉංජිනේරු වෙළඳපොළ තුළ උපායමාර්ග වශයෙන් ස්ථානගත වීම සඳහා මෙහෙයුම් සහ කළමනාකරණ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිණිස 2015 වර්ෂයේදී මඉඋකා සහ එහි ඉදිකිරීම් අංශය වන මඉසේස එකිනෙකට වෙනස් සංස්ථාපිත ආයතන දෙකක් ලෙස වඩාත් විධිමත් වෙන්වීමක් පෙන්නුම් කරන ලදී. බාහිර වශයෙන් රජයන් වෙනස්වීම  යහපාලනය කරා වඩාත් වැඩි අවධාරණයක් ඇති කරන ලදි.

ආනුෂංගිකව, ක්‍රියාශීලී ආයතනයක් ලෙස, අභියෝගාත්මක අභියෝගයකට මුහුණ දීම සඳහා සහ දිවයිනෙහි ප්‍රධාන ඉංජිනේරු උපදේශන ආයතනය ලෙස සිය තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා මඉඋකා මූලෝපායික ලෙස ප්‍රති නිර්මාණය කරන ලදී. මහා පරිමාණ ඉංජිනේරු ව්‍යාපෘතිවල කඩාවැටීම හේතුවෙන් 2015 වර්ෂයේදී ඉදිකිරීම් අංශයේ මන්දගාමීත්වයක් ඇති වූ බව මහ බැංකුව විසින් වාර්තා කරන ලදී. කෙසේවෙතත්, ඉහළ වටිනාකමකින් යුත් ඉංජිනේරු උපදේශන හා ජාතික වැදගත්කමකින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති ලබා ගැනීමේ ශක්තිය අඛණ්ඩව පවත්වාගැනීම සඳහා අභියෝගවලට සාර්ථකව මුහුණ දීමටද පසුගිය වසරවල ජයග්‍රහණ තහවුරු කිරීමට සහ ඉපැයීම් සහ ලාභ සඳහා නව වාර්තා තැබීමට අපට හැකි විය. 2015 වර්ෂයේ දී උපදේශන අංශය හිතකර ආදායම් වර්ධන වේගයක් පවත්වා ගන්නා ලද අතර රුපියල් බිලියන 1.98 ක ආදායමක් සාක්ෂාත් කර කරගෙන ඇත. අපේක්ෂා කළ පරිදි ඉදිකිරීම් ආදායම එම කාලසීමාව තුළදී 22%කින් රුපියල් බිලියන 8.73 ක් දක්වා අඩු විය. අනාගතය දෙස බැලීමේදී, අපගේ ප්‍රධාන දක්ෂතාවයන් සහ අත්දැකීම් රැඳී පවතින උපදේශන අංශවල වැඩිදුර වර්ධනයට අවධානය යොමු කිරීම අපගේ උපාය මාර්ගය වනු ඇත.

ස්වයං-ආදායම් උත්පාදනය කරනු ලබන රජය සතු ව්‍යවසායක් ලෙස, කාර්යාංශය කළුගඟ, මොරගහකන්ද, උමා ඔය, බොරලන්ද වැනි ජාතික වැදගත්කමකින් යුතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා එහි වටිනා ඉංජිනේරුමය උපදේශන තුළින් ජාතික ආර්ථිකයට අඛණ්ඩව සුවිශේෂී දායකත්වයක් දක්වන ලදී. අපගේ සියලු නියාමන බැඳීම් පූර්ණ වශයෙන් සපුරාලන අතරම, දිවයිනෙහි ඉංජිනේරුවන් සහ අනෙකුත් වෘත්තිකයන් විශාල සංඛ්‍යාවක් සඳහා රැකියා උත්පාදනය කිරීම අඛණ්ඩව සිදු කර ඇත.


ඉහළ පුහුණුවක් සහිත සුදුසුකම්ලත් වෘත්තිකයින් සහ සහාය කාර්ය මණ්ඩලය සමඟ මඉඋකා විවිධාකාර ඉංජිනේරු ක්ෂේත්‍රවල බහු -විෂය විශේෂඥතාවය සහ සම කළ නොහැකි දක්ෂතා සමූහය සඳහා පිළිගැනීමට සහ හඳුනාගැනීමට ලක්ව ඇත. එබැවින්, අඛණ්ඩ දැනුම යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක් ලෙස කාර්යමණ්ඩල පුහුණුව, නිපුණතා සංවර්ධනය අප විසින් හඳුනාගනු ලැබේ. 2015 වර්ෂය තුළ සීසීබීබී ආයතනය විසින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 19 දෙනෙකුට පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා රුපියල් මිලියන 4.5 ක් ආයෝජනය කර ඇති අතර එළිමහන් කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 3.32 ක් වැය කර ඇත. ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා අප අඛණ්ඩව ආයෝජනය කරන අතරම මඉඋකා සමඟ ඔවුන්ගේ වෘත්තීය ජීවිතය තුළ පෞද්ගලික වර්ධන අවස්ථා සහතික කරන්නෙමු. විශ්වවිද්‍යාල 10 ක සහ සහ කාර්මික/වෘත්තීය පුහුණු ආයතන 07 ක් සිසුන් 436 ක් සඳහා කාර්මික පුහුණුව ලබා දීම තුළින් කාර්යාංශය ජාතික ඉංජිනේරු අධ්‍යාපනය සඳහාද දායකත්වය ලබා දුනි. අපගේ සමාජ වගකීම්වල කොටසක් ලෙස රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද රෝග ශල්‍යාගාරය සඳහා රු.මිලියන 1.5ක් වටිනා වෙනස් කිරීම් සිදු කිරීමට ආයතනික සමාජ වගකීම් මුලපිරීමක් ලෙස භාර ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ක්ෂේත්‍රෙය් ගෞරවයට හා පිළිගැනිමට ලක්වූ  මඉඋකා හි විශේෂත්වය තවදුරටත් උසස් කිරීම සඳහා මඉඋකා ආයතනයට නායකත්වය සැපයීම සඳහා සභාපති, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්-වය සහ සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් ලැබුණු සහයෝගය ස්තුති පූර්වකව පිළිගනිමින් මෙම සටහන අවසන් කිරීමට කැමැත්තෙමි. 2015 වසර ඵලදායී වසරක් බව සැලකිය යුතු කරුණකි. අපගේ ඉලක්කයන් සපුරා ගැනීමට හැකි වූ අතර ඉදිරි වසරවලදී අපගේ අනාගත අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට ධනාත්මකව බලාපොරොත්තු වන්නෙමු.

# මූල්‍යමය විශේෂතා

| | සමූහය | | මඉදකා | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 |
| | රු. | රු. | රු. | රු. |
| ඉදිකිරීම් ආදායම | 9,458 | 11,274 | 8,734 | 11,127 |
| උපදේශන ආදායම | 1,966 | 2,128 | 1,976 | 2,132 |
| ඒකාබද්ධ ආදායම | 11,424 | 13,402 | 10,710 | 13,260 |
| දළ ලාභය | 1,744 | 1,914 | 1,262 | 1,603 |
| බදු පෙර ශුද්ධ ලාභය | 714 | 684 | 596 | 552 |
| බදු පසු ශුද්ධ ලාභය | 426 | 412 | 345 | 309 |
| මුළු වත්කම් | 16,804 | 15,951 | 16,607 | 17,027 |
| දායක ප්‍රාග්ධනය | 0.50 | 0.50 | 0.50 | 0.50 |
| මුළු හිමිකම | 4,956 | 4,530 | 4,748 | 4,403 |
| මුළු හිමිකම් සමතුලිතතාවය | 16,804 | 15,951 | 16,607 | 17,027 |
| ජංගම වත්කම් | 13,676 | 12,618 | 13,876 | 14,087 |
| ජංගම බැරකම් | 11,653 | 11,232 | 11,683 | 12,442 |

## සමූහයේ මූල්‍යමය විශේෂතා



# අධ්‍යක්ෂ මණ්ඩලය



### ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා

BSc.(Eng), PG Dip (Const.Mgt), PG Dip (Port & Coastal) Norway, MIE(SL) C.Eng, MASCE

**සභාපති**

2015 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලදී. සමගාමීව මඉුදකා හි ඉදිකිරීම් ඉංජිනේරු අංශය වන මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමේ සභාපති වශයෙන්ද කටයුතු කරයි. 2015 වර්ෂයේදී දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන ලදී. එයට සමගාමීව, මඉුදකා හි ඉදිකිරීම් ඉංජිනේරු අංශය වන මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගමේ සභාපති ලෙසද කටයුතු කරයි. 2010 වර්ෂයේ සිට ඒකාබද්ධ අතිරේක සාමාන්‍යාධිකාරි (EPC) ලෙස එහි කටයුතුවලදී අධ්‍යක්ෂක මණ්ඩලයට සෘජු සහය ලබා දෙන ලදී. සම්පූර්ණයෙන්ම මඉුදකා හීදී විවිධ තනතුරු හොබවමින් අත්පත් කර ගන්නා ලද වසර 34 ක ඉංජිනේරුමය හා කළමනාකරණ පුථෘල පළපුරුද්දක් ඇති අතර ඉංජිනේරු 1983 වසරේදී වික්ටෝරියා ජලවිදුලි ව්‍යාපෘතියේ නේවාසික ඉංජිනේරුවෙකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කර, ව්‍යාපෘති ඉංජිනේරුවෙකු ලෙස (1995) ව්‍යාපෘති කණ්ඩායම් නායකයෙකු (1996), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (2005) සහ 2010 වර්ෂයේදී අතිරේක සාමාන්‍යාධිකාරි වශයෙන් ගත වූ වර්ෂවලදී ඉහළයන වගකීම් සහ උසස්වීම් ලබා ගෙන ඇත. ඔහුගේ දිගුකාලීන වෘත්තීය ජීවිතයේදී භාරගත් විවිධාකාරි ව්‍යාපෘතියේ කළමණාකරනය කිරීම තුළින් උකහාගත් සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුම සහ පුළුල් විශේෂඥතාවය අධ්‍යක්ෂ මණ්ඩලය කරා ගෙන ගොස් ඇත.



### එම්.ආර්.ජී. රණතුංග මහතා

LL.B (Sri Lanka), නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්, සමාගම් ලේකම්, වැ.බ. මහේස්ත්‍රාත්.

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

2015 වර්ෂයේදී ක්‍රියාකාරි අධ්‍යක්ෂකවරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. මීට පෙර වර්ෂ 2007 සිට 2010 දක්වා කාලය තුළ ක්‍රියාකාරි අධ්‍යක්ෂ ලෙස මඉුදකා හි සේවය කළේය. එසේම ඔහු සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් (පෞද්.) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. වර්තමානයේදී අධ්‍යක්ෂ, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ, ආරක්ෂක අමාත්‍යාංශය, ලේකම්, රක්නා ලංකා (පෞද්.) සමාගම ලෙසද කටයුතු කරයි. මීට පෙර අධියක්ෂ, ජල සම්පත් මණ්ඩලය සහ අධ්‍යක්ෂ, පොහොර සංස්ථාව යන තනතුරු හොබවා ඇත. මුලින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ උතුරු මැද පළාතේ කලාපීය උප සභාපති ලෙසද කටයුතු කර ඇත.



### ඉංජි. එන්. රූපසිංහ මහතා

BSc.Eng.(Hons),PG Dip. (Hydropower)Norway, C.Eng.,MIE (SL), MICE (London), බලයලත් මැනුම්කරු

**අධ්‍යක්ෂ**

2015 වර්ෂයේදී අධ්‍යක්ෂකවරයෙකු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. 2015 වර්ෂයේ සිට මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ජාතික වැදගත්කමකින් යුත් සංවර්ධන වගකීම් දරයි. වර්ෂ 2005 සිට 2014 දක්වා මඉුදකා හි සභාපතිවරයා ලෙස සේවය කරන ලදී. 1981 දී සිවිල් ඉංජිනේරුවකු ලෙස මඉුදකා ට සම්බන්ධ වී සිවිල් ඉංජිනේරුවෙකු, නේවාසික ඉංජිනේරුවරයෙකු, ප්‍රධාන නේවාසික ඉංජිනේරුවරයෙකු, ව්‍යාපෘති කළමනාකරුවෙකු, අතිරේක සාමාන්‍යාධිකාරි සහ සාමාන්‍යාධිකාරි ලෙස කටයුතු කර වර්ෂ 34කට වඩා වැඩි පෘථුල ඉංජිනේරුමය සහ කළමනාකරණ පළපුරුද්දක් කාර්යාංශය තුළින් ලබා ගෙන ඇත. ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) අංශය ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරු (යටිතල ව්‍යුහ ඉදිකිරීම්) සහ අතිරේක සාමාන්‍යාධිකාරී ලෙස (EPC) ලෙස පුරෝගාමී මෙහෙවරක නිරත විය.



### ඉංජි. එච්.බී. ජයසේකර මහතා

BSc.(Eng.), C.Eng., MICE(UK), FIE(SL)

#### අධ්‍යක්ෂ

2015 වර්ෂයේදී අධ්‍යක්ෂකවරයෙකු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. වර්ෂ 2000 සිට 2004 දක්වා මඉඋකා හි සභාපතිවරයා ලෙස කටයුතු කර ඇත. දේශීයව ජාතික මට්ටමින් සහ විදේශගතව ඉංජිනේරුමය හා කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සැලසුම් ඉංජිනේරු ලෙස (1965 සිට 1967) දක්වා නේවාසික ඉංජිනේරු ලෙස (1967-1968) දක්වා සහ නේවාසික ඉදිකිරීමේ කළමනාකරු ලෙස (1970 සිට 1972) සේවය කර ඇත. වර්ෂ 1977 දී ප්‍රධාන ව්‍යාපෘති ඉංජිනේරු ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට සම්බන්ධ වී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (1978-1986), අතිරේක සාමාන්‍යාධිකාරි, ජල සම්පත් හා සැලසුම් (1986-1995) ලෙස උසස්වීම් ලබා වර්ෂ 1995 සිට 1996 දක්වා සාමාන්‍යාධිකාරි ලෙස කටයුතු කරන ලදී. එක්සත් රාජධානියේ වන සංරක්ෂණ කොමිෂන් සභාවේ, ප්‍රධාන කාර්යාලයේ වර්ෂ 1968 සිට 1970 දක්වා සේවය කරන ලද අතර එක්සත් රාජධානියේ කෙන්ට් ප්‍රාන්ත කවුන්සිලයේ නියෝජ්‍ය අංශ ඉංජිනේරු ලෙස වර්ෂ 1972 සිට 1977 දක්වා සේවය කර ඇත.



### එස්.එම්.එන්.එල්. සේනානායක මහතා

BSc., Dip. Mgt., FCA, වරලත් ගණකාධිකාරී.

#### අධ්‍යක්ෂ

2004 සිට මඉඋකා හි අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර, 2015 වර්ෂයේ සිට අධ්‍යක්ෂවරයෙකු ලෙස ලෙස අධ්‍යක්ෂක මණ්ඩලයට නැවත පත්කර ඇත. මධ්‍යම ඉංජිනේරු සේවා (PVT) සමාගමේ සමාගම් ලේකම්, ලෙස කටයුතු කරන ලදී. පුළුල් මූල්‍ය කළමනාකරණය සහ ගිණුම්කරණ අත්දැකීම් සහිත වේ. වර්ෂ 1988 සිට කෝපරේට් විෂන් (පෞද්.) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සහ වර්ෂ 1994 සිට ෆයිනෑන්ෂල් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් ඒලයිඩ් සර්විසස් (පෞද්.) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.



### පී.බී.එස්.සී. නෝනිස් මහතා

B.Sc. (Business Admin) Hons –ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය ඕස්ට්‍රේලියාව, LICA – ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

#### අධ්‍යක්ෂ

මඉඋකා හි අධ්‍යක්ෂ මණ්ඩලය තුළ භාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂවරයෙකු ලෙස 2015 දී පත් කර ඇති අතර CECB හි විගණන කළමණාකරණ කමිටුවේ වත්මන් සභාපතිවරයා ලෙස කටයුතු කරයි. මුදල් අමාත්‍යාංශයේ සහ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ නිත්‍ය අධ්‍යක්ෂ තනතුරක් දරයි. විවිධාකාර හා පුළුල් ශ්‍රී ලංකා පරිපාලන සේවා (SLAS) අත්දැකීම් සහිත වේ. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ සහකාර ලේකම් (1998) ලෙස SLAS වෘත්තීය ජීවිතය ආරම්භ කර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (2002), වෙළඳ තීරුබදු හා ආයෝජන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (2009) සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස (2009) සහ 2011 වර්ෂයේදී ජ්‍යේෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරන ලද අතර, 2014 වර්ෂයේදී ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) ලෙස පත් කරන ලදී.

# කළමනාකරණ කණ්ඩායම

**ඉංජි.පී.ඩී.ඒ.පියතිලක මහතා**
සභාපති

**ඉංජි. කේ.එල්.එස්. සහබන්දු මහතා**
සාමාන්‍යාධිකාරී

**ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා**
ඒකාබ. අති. සාමාන්‍යාධිකාරී
(EPC)

**ඉංජි. ටී.ඩී. වික්‍රමරත්න මහතා**
ඒකාබ. අති. සාමාන්‍යාධිකාරී
(ඉදි.) / සහකාර සාමාන්‍යාධිකාරී (ජල සම්පත්)

**ඉංජි. පී.ඩී.ඒ. පියතිලක මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC-WP 1)

**ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා**
ඒකාබ. අති. සාමාන්‍යාධිකාරී (EPC)

**ඉංජි. ඒච්.ඒම්. නන්දෙස්න මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී (EPC-මධ්‍යම)

**ඉංජි. ඩී.ආර්.මිත්‍රා මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී
(EPC-උතුරු මැද)

**ඉංජි. ඒ. ගල්කැටිය මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී
(විශේෂ ව්‍යාපෘති - 2)

**ඉංජි. පී.ආර්.ඒ.එස්. ගුණතිලක මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී
(EPC-නැගෙනහිර)

**ඉංජි. එච්.එම්.එස්.රූපසිංහ මිය.**
අතිරේක සාමාන්‍යාධිකාරී
(EPC-ආධාරක සේවා)

**ඉංජි. ඩබ්.ඒ.ආරියතිලක මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී
(උතුරු මාර්ග)

**ඉංජි. කේ.එල්.එස්.ආර්. සහබන්දු මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(සැලසුම් 01)

**ඉංජි. පී.සී. ජිනසේන මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී (DHQC)

**ඉංජි. පී.ඒ.ඩී.එල්.ජේ. සෙනෙවිරත්න මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී
(E & M)

**ඉංජි. යු.එස්. කරුණාරත්න මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී
(EPC-WP 2)

**ඉංජි. ඒ.ඒ.පී. අදිකාරි මිය.**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(සැලසුම් 02)

**ඉංජි. ටී.පී.ඩී.ටී. ධර්මවර්ධන මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(ව්‍යාපෘති)

**ගෘහනිර්මාණ ශිල්පී ඩබ්.කේ.**
**ලලිත් හේවගේ මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී (ගෘහ නිර්මාණ)

**ඉංජි. පී.ආර්.ඒ.එස්. ගුණතිලක මහතා**
අතිරේක සාමාන්‍යාධිකාරී
(EPC-නැගෙනහිර)

**ඉංජි. පී.එම්.පී.සී. ගුණතිලක මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(EPC-ගිණිකොන)

**ඉංජි. එස්.ඒ.යු.ඩී.සී. සිරිවර්ධන මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(ජල සම්පත්)

**ඉංජි.ඩබ්.ඊ.පී. රන්ජන් කුමාර මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(සබරගමුව)

**ඉංජි. එම්.එන්. ගුණසේන මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(ඌව)

**ඉංජි. ඒ. පුෂ්පරාජ් මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(EPC-උතුර)

**ඉංජි.එච්.ආර්.ඩබ්.කේ.හින්දෙණිය මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගම්පහ)

**ඉංජි. එස්.එස්.ඒ. කළුගල්දෙණිය මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(සැලසුම් 03)

**ඉංජි. විරාජ් ඩයස් මහතා**
වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී
(NRM&LS)

**ලියනගේ දේවිකා මිය.**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ප්‍රමාණ සමීක්ෂක)

**ඉංජි. ඒ.සී. ජයතිලක මහතා**
වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(IT)

**ජේ.එම්.බී. ජයවීර මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක

**එස්.එච්.එච්.සී.යු. සේනානායක මිය.**
නීති නිලධාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

**ජේ.ඩබ්. රත්නායක මහතා**
උපදේශක,මානව සම්පත්

**යු.එන්.බී. මාවතගම මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2015

### නීතිමය තත්ත්වය

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (මඉඋකා), ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා බහු-විෂය උපදේශන සේවාවන් සැපයීම සඳහා වර්ෂ 1973 අප්‍රේල් මස 10 වැනි දින පිහිටුවන ලදී. එය වර්ෂ 1957අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

මහජන සම්පත්වල භාරකාරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය එයට පවරා ඇති අයිතීන් සහ වගකීම් ඒකාබද්ධව සහ විශ්වාසනීයව ඉටු කළ යුතුය. නිසි සැලසුමකින් තොරව සිදුකරන ඕනෑම තීරණ හා ක්‍රියාවන් හේතුවෙන් අවසානයේ දී මහජනයා විසින් විශාල විශයෙන් වන්දි ගෙවිය යුතු වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය සෑම විටම සිය භාරදූර වගකීම් පිළිබඳව විමසිලිමත් විය යුතුය.

### යහ භාවිතයන්

ව්‍යවසායේ යහපත වෙනුවෙන් උපායශීලී තීරණ විවෘතව හා නිර්මාණාත්මකව විවාද කරනු ලබන සුපරීක්ෂාකාරී සහ හොඳින් ක්‍රියාත්මක වන අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ඒකාබද්ධ පාලනයෙහි යහ භාවිතයන් විසින් මඟ පෙන්වනු ඇත. මේ සඳහා සාමාජිකයන්ගේ මතභේදකාරී අදහස් ද සවන් දිය යුතුය. එක් විසංතිකයෙකුට මණ්ඩලයක් මත විශාල වෙනසක් සිදු කළ හැකි ය. "ඉහළම කාර්ය සාධනයක් සහිත සමාගම් විසම්මුතිය වගකීමක් ලෙස සලකන සහ කිසිදු කරුණක් සාකච්ඡා කළ නොහැකි යැයි නොසළකන අතිශයින් විවාදාත්මක අධ්‍යක්ෂ මණ්ඩලයන්ගෙන් සමන්විත වේ".

### නායකත්ව කාර්ය භාරය

එහි නායකත්ව කාර්ය භාරයේදී, අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරවලය පහත සඳහන් දෑ ඇතුලත් විය යුතුය:

- ව්‍යවසායේ මෙහෙවර සහ එහි කොටස් හිමියන්ගේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සේවය කළ හැකි හොඳම ආකාරය නිර්ණය කිරීම.
- නීතිමය අවශ්‍යයතා සපුරා ඇති බව සහ සංස්ථාගත කිරීමේ පනතේ ව්‍යවස්ථාවේ සහ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව ව්‍යවසායෙහි මෙහෙයුම් කටයුතු සිදු වනුනේද යන්න සහතික කිරීම.
- සිය කොටස් හිමියන් හා අනෙකුත් පාර්ශවකරුවන්ට ප්‍රශස්ත ප්‍රතිඵල ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස කළමණාකරණය විසින් ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිපත්ති රාමුගත කිරීම.
- අනාගත වර්ධනය සඳහා දිගුකාලීන අභිමතාර්ථ සහ අරමුණු සම්පාදනය කිරීම සඳහා රාජ්‍ය ප්‍රත්තිමය අරමුණු වරින්වර සමාලෝචනය කර උපාය මාර්ගික උපදෙස් සැපයීම.
- ව්‍යවසායේ සුමට ක්‍රියාකාරිත්වය උදෙසා අභිමතාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් බාධාවලින් තොරව කාලානුරූපී පදනමකින් උත්පාදනය කිරීම හෝ ලබා ගැනීම හෝ තහවුරු කිරීම.
- ප්‍රමාණවත් වාර්තා සහ ගිණුම් පවත්වාගෙන යාමෙන් නිසි වගවීම සහතික කිරීම.
- බාධා කිරී, පසුබෑම් ආදියෙන් ව්‍යාපාරයට සිදුවිය හැකි වැළැක්වීම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම ආදිය.

### අධීක්ෂණ කාර්ය භාරය

එහි අධීක්ෂණ ක්‍රියාකලාපය පිළිබඳව සැළකීමේදී ව්‍යවසායේ සමස්ත කළමනාකරණය සඳහා සහ වගකීම් ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් අතර පුළුල්ව බෙදාගත් ඵලදායී පාලන පද්ධති ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමක් වනුයේ:

- ආයතනයේ සහ වැඩි වශයෙන් මහජනතාවගේ යහපත උදෙසා සහ ඒවා රාමු ගත කර ඇති අදහසින්ම අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන බවට වග බලා ගැනීම.
- ව්‍යවසාය එහි මෙහෙයුම් කටයුතු නිවැරදිව සිදු කරනු ලබන්නේද යන්න පිළිබඳව වග බලා ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු වාර්තා සහ කාර්ය සාධනය ඇගයීම මඟින් කළමනාකරණයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.
- ප්‍රතිඵල අපේක්ෂිත අපේක්ෂාවන් සමඟ නොගැලපෙන්නේ නම්, අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ප්‍රමාදයකින් තොරව නිවැරදි කිරීමේ පියවර ගැනීම.
- කළමනාකරුවන් ලෙස දක්ෂ පුද්ගලයන් පත් කිරීම සහ ස්වාධීනව හා වගකිවයුතු ලෙස සිය කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු පරිසරයක් ලබා දීම තුළින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර නිසි බලය පැවරීම සහ කණ්ඩායම් හැඟීමක් ඇති බවට වගබලා ගැනීම.
- වාර්ෂික මහා සභා රැස්වීම්වලදී කොටස්කරුවන්ට වාර්තා කිරීම/පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) රැස්වීම්වලට සහභාගී වීම.

## සංයුතිය

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ සභාපතිවරයා ඇතුළුව, අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 06 දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පහත පරිදි වේ ;

- ඉංජි. ජී.ඩී.ඒ.පියතිලක මහතා — **සභාපති**
- එම්.ආර්.ජී. රණතුංග මහතා — **ක්‍රියාකාරී අධ්‍යක්ෂ**
- ඉංජි. එන්. රූපසිංහ මහතා — **අධ්‍යක්ෂ**
- එස්.එම්.එන්.එල්. සේනානායක මහතා — **අධ්‍යක්ෂ**
- ඉංජි. එච්.බී. ජයසේකර මහතා — **අධ්‍යක්ෂ**
- පී.බී.එස්.සී. නෝනිස් මහතා — **අධ්‍යක්ෂ**

## රැස්වීම් සහ ඒ සඳහා සහභාගී වීම

2015 මූල්‍ය වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 14ක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

| නම | තනතුර | 2015 | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පෙබ 12 | මාර්තු 26 | අප්‍රේල් 29 | මැයි 29 | ජූනි 03 | ජූනි 30 | ජූලි 27 | අගෝ. 13 | අගෝ. 31 | සැප්. 30 | ඔක්. 29 | නොවැ. 26 | දෙසැ. 04 | දෙසැ. 30 |
| ඉංජි. ජී.ඩී.ඒ.පියතිලක මහතා | සභාපති | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| එම්.ආර්.ජී. රණතුංග මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | √ | √ | √ | √ | - | √ | - | √ | - | √ | √ | √ | - | √ |
| ඉංජි. එන්. රූපසිංහ මහතා | අධ්‍යක්ෂ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| එස්.එම්.එන්.එල්.සේනානායක මහතා | අධ්‍යක්ෂ | √ | - | √ | √ | √ | √ | √ | √ | - | √ | √ | √ | √ | √ |
| ඉංජි. එච්.බී. ජයසේකර මහතා | අධ්‍යක්ෂ | √ | √ | - | √ | √ | √ | √ | - | - | √ | √ | √ | √ | √ |
| පී.බී.එස්.සී. නෝනිස් මහතා | අධ්‍යක්ෂ | - | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |



# විගණන කමිටු වාර්තාව

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 55 අනුව, අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ වෙනත් අදාළ නීතිමය අවශ්‍යතාතා වලට අනුකූලව මූල්‍ය වාර්තාකරණය සිදුවන බව සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීමේ අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය භාරයට සහාය වීමේ වගකීම විගණන කමිටුව විසින් දරනු ලැබේ. තවද, අඛණ්ඩ සමාලෝචනය, නිරීක්ෂණ කිරීම, නොගැලපීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ ඉදිරිපත් කිරීම මගින් රජය විසින් නිකුත් කරනු ලබන  අදාළ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛ සියල්ල අනුගමනය කරනු ලබන බව  සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතුය. විගණන කමිටුව විසින් අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපිලේඛන COPE නිර්දේශයන් සමාලෝචනය කළ යුතු වන අතර ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතුය. ඊට අමතරව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට සහාය විය යුතුය. කාරක සභාව අවම වශයෙන් මාස තුනකට වරක් රැස්විය යුතු වන අතර, ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම සඳහා එහි නිර්දේශයන් එම රැස්වීමෙහි කාර්ය සටහන් සමඟ ඉන් පසුව හැකි ඉක්මනින්ම එහි අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.  විගණන කමිටුවේ යොමු කිරීමේ අනුදේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබේ.

## යොමු කිරීමේ අනුදේශ

කාරක සභාව පාලනය කරනු ලබන්නේ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 55 අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරන ලද විශේෂිත යොමු කිරීමේ අනුදේශයන් (TOR) මගින් වේ. යොමු කිරීමේ අනුදේශයන් සහ රජයේ අවශ්‍යතාවයන්ට අනුව කමිටුවේ වගකීම් ඉටු කිරීමේදී කමිටුව පහත සඳහන් අරමුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලැබේ.

- අභ්‍යන්තර විගණන ඒකකයෙහි වගකීම් නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම.
- ආයතනයේ සියළු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද සමාලෝචනය කිරීම නිශ්චය කිරීම.
- පිරිවැය ඵලදායිත්වය සහ නාස්තිකාර වියදම් ආදිය බැහැර කිරීම කිරීම සඳහා ඒකකාර කාල අන්තරයන්ගෙන් කාර්ය සාධනය සමාලෝචනය කිරීම.
- බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය කිරීම සහ විගණකාධිපතිවරයාගේ/බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි අනුව කටයුතු කිරීම.
- ව්‍යවස්ථා, රෙගුලාසි සහ චක්‍රලේඛවලට අනුකූල වන්නේද යන්න  නිශ්චය කිරීම.
- ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල වන බව සහතික කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
- ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ උපදේශක කාරක සභාවේ නිර්දේශ/මඟපෙන්වීම් ක්‍රියාවට නැංවීම සමාලෝචනය කිරීම.
- වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සදහා කමිටුවේ සොයාගැනීම් පිළිබද වාර්තාවක් සකස් කිරීම.
- ව්‍යවසාය සතු අනුබද්ධිත ආයතන තිබේ නම්, ඒවාට අදාල ගැටළු නිරන්තරයෙන් නිරාකරණය කිරීම.

## සංයුතිය

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 55 හි විධිවිධාන ප්‍රකාරව, කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන භාණ්ඩාගාර නියෝජිතවරයාද ඇතුළුව කාර්යාංශයේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් (03) සමන්විත වේ.

විගණන කමිටුවේ වර්තමාන සාමාජිකයින් පහත පරිදි වේ:

- පී.බී.එස්.සී. නෝනිස් මහතා — **අධ්‍යක්ෂ/කමිටුවේ සභාපති**
- එස්.එම්.එන්.එල්. සේනානායක මහතා — **අධ්‍යක්ෂ**
- ඉංජි. එච්.බී. ජයසේකර මහතා — **අධ්‍යක්ෂ**

මූල්‍ය හා කළමනාකරණ විශේෂඥතාවය සමඟ කමිටුවට වාණිජ හා රාජ්‍ය අංශයෙහි සම්මිශ්‍රණය වූ පළපුරුද්දක් ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් එච්.සී.යූ. සේනානායක මහතා විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරන අතර විගණන කමිටුවේ කැඳවුම්කරු ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී ජේ.එම්.බී. ජයවීර මහතා කටයුතු කරයි.

## රැස්වීම් සහ ඒ සඳහා පැමිණීම

විගණන කමිටුව 2015 මූල්‍ය වර්ෂය තුළදී අවස්ථා පහකදී රැස්වී ඇති අතර ඔවුන්ගේ පැමිණීම පහත දැක්වෙන පරිදි වේ:

| නම | 2015 | | | | |
|---|---|---|---|---|---|
| | 7 අප්‍රේල් | 14 මැයි | 15 ජූනි | 21 ජූලි | 10 අගෝස්තු |
| පී.බී.එස්.සී. නෝනිස් මහතා | √ | √ | √ | √ | √ |
| එස්.එම්.එන්.එල්.සේනානායක මහතා | √ | √ | √ | √ | √ |
| ඉංජි. එච්.බී. ජයසේකර මහතා | √ | - | √ | - | √ |



වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් මෙන්ම බාහිර විගණන නිලධාරීන්ට සුදුසු අවස්ථාවලදී සාකච්ඡා සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලැබේ. විගණන කමිටුවේ කටයුතු නිරන්තරයෙන් ලෙසෙ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

## අනුකූල වීම

අදාළ නීති  හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියාකාරී වීමට කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහතික වන අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන බව සහතික කරනු ලැබේ. පවතින පාලන ක්‍රම සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණාත්මකභාවය පිළිබඳව කමිටුව ඇගයීමක් සිදු කරන ලද පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය අතිරේක පාලනයන් සහ අවදානම් වැළැක්වීමේ උපායමාර්ගයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී. තවද කාරක සභාව විසින් කාර්යාංශයේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වය සමාලෝචනය කර එහි ව්‍යාපාර කටයුතු සඳහා අනාගත අපේක්ෂාවන් පිලිබඳව ඇගයීමක් සිදු කර, ඒ අනුව අදාළ ගිණුම් වාර්තා පිළියෙල කිරීම සඳහා භාවිත කරන ලද අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය යෝග්‍ය වන බව සහතික කර ඇත.

## බාහිර විගණනය

බාහිර විගණනය කාර්යාංශයේ බාහිර විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා කටයුතු කරනු ලැබේ.

**පී.බී.එස්.සී. නෝනිස්**
**සභාපති - විගණන සහ කළමනාකරණ කමිටුව**



# ඒකාබද්ධ තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ඒකාබද්ධ තොරතුරු

### 1.1 පිහිටීම සහ නීතිමය තත්ත්වය

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය, වර්ෂ 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනතේ ප්‍රතිපාදන යටතේ ස්ථාපිත ශ්‍රී ලංකාවේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටා ඇත.

2013 දෙසැම්බර් මස 31 වැනි දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, කාර්යාංශය සහ එහි පරිපාලිත සමාගම්වලින් (එක්ව ගත්කල "සමූහය" ලෙස හැඳින්වෙන) සමන්විත වේ.

කාර්යාංශයේ සියළු සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය ප්‍රධාන වශයෙන් ඉදිකිරීම්, උපදේශන සහ ඕනෑම ඉංජිනේරුමය සම්බන්ධිත ක්‍රියාකාරකම් ව්‍යාපාරයන්හි නිරතව සිටී.

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම (මඉසේස) සම්පූර්ණයෙන්ම මඉඋකා ට අයත් පරිපාලිත සමාගමක් වන අතර ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත එම ආයතනය විසින් හෝ සමූහ ව්‍යාපාරයක හෝ සමූහයක සමාජිකයෙකු ලෙස සිවිල්, විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි ඉදිකිරීම්-සැලසුම්, ටර්න්කී සහ වෙනත් ආකාරයේ ඉදිකිරීම් කාර්යයන් මෙන්ම ඒ හා සම්බන්ධිත හෝ අනුබද්ධ හෝ ඊට අනුෂංගික ව්‍යාපාර භාරගැනීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නිරතව සිටී.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සම කොටස්වල වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය මෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින්ද සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS සහ LKAS) අනුව සකස් කර ඇත.

විශේෂයෙන් සඳහන් කර නොමැති නම් පරිපාලිත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන, කාර්යාංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වන ලෙස සකස් කර ඇත.

### 2.2 ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මතු දැක්වෙන භෞතික අයිතමයන් සඳහා හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

- සාධාරණ වටිනාකමට අගයන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම්
- දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල සාධාරණ වටිනාකම සංක්‍රමන දිනට උපකල්පිත පිරිවැය ලෙස හඳුනාගනු ලැබේ.

ප්‍රත්‍යාසන්න අනාගතයේදී අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට සමූහයට ඇති හැකියාව කාර්යාංශයේ අධ්‍යක්ෂවරුන් විසින් ඇගයීමට ලක් කර ඇති අතර ව්‍යාපාරය ඈවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් එහිදී පෙනී ගොස් නොමැත.

### 2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

කාර්යාංශයේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

## 2.4 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLFRSs) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා, වත්කම් සහ බැරකම්, ආදායම් සහ වියදම් වල ප්‍රතිපත්ති සහ වාර්තාගත ප්‍රමාණයන් යොදාගැනීමට බලපෑම් ඇති කරන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන, අතීත අත්දැකීම් සහ අදාල තත්ත්වයන් යටතේ සාධාරණ යැයි හැඟෙන වෙනත් විවිධ සාධක මත පදනම් වන අතර එහි ප්‍රතිඵල විසින් වෙනත් ප්‍රභවයන්ගෙන් පහසුවෙන් ගම්‍යමාන නොවන වත්කම් සහ බැරකම් වල පවතින වටිනාකම් සම්බන්ධයෙන් තීන්දු ගැනීමේදී පදනම සකස් කරනු ලැබේ.

ඉදිරියට යෑමේ පදනම මත ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අගයනු ලැබේ. සංශෝධනය බලපානු ලබන්නේ එම මූල්‍ය වර්ෂය සඳහා හෝ සංශෝධනයේ කාලපරිච්ඡේදය සඳහා පමණක් නම් ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයේදී ද වර්තමාන සහ අනාගත යන මූල්‍ය වර්ෂ දෙවර්ගය සඳහාම සංශෝධනය බලපානු ලබන්නේ නම් අනාගත කාලපරිච්ඡේදයේදී ද ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන හඳුනාගනු ලැබේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගනු ලැබූ ප්‍රමාණයන් මත වඩාත් සැළකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මතු දැක්වෙන සටහන් වල ඇතුලත් කර ඇත:

| තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු/ තීන්දු | සටහන් අංකය | පිටු අංකය |
|---|---|---|
| කොන්ත්‍රාත් ආදායම, පිරිවැය සහ නිම කරන ලද ප්‍රතිශතය | 09 | 28 |

මූල්‍ය ප්‍රකාශන වල ද්‍රව්‍යමය සීරුමාරුවක් ප්‍රතිඵලය විය හැකි සැළකිය යුතු අවදානමක් ඇති උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයන් පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දක්වා ඇත:

| තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු/ තීන්දු | සටහන් අංකය | පිටු අංකය |
|---|---|---|
| දේපළ,පිරියත සහ යන්ත්‍රෝපකරණ | 15 | 29/30 |
| සේවක ප්‍රතිලාභ | 22 | 32 |
| විලම්භිත බදු බැරකම් | 23 | 33 |

## 2.5 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම

(a) අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම

වර්තමාන අගයට එහි අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම මැනීම සඳහා සමාගම LKAS 19 සේවක ප්‍රතිලාභී යොදා ගෙන ඇත LKAS 19 - සේවක ප්‍රතිලාභී මඟින් නිර්දේශ කර ඇති පර්දි ව්‍යාපෘති ඒකක බැර (PUC) ක්‍රමවේදය භාවිතා කර ස්වාධීන ආයුගණක නිලධාරීන් විසින් වාර්ෂික අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම ගණනය කරනු ලැබේ. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් සඳහා ආයුගණක ලාභ සහ අලාභ ඒවා සිදු වූ කාල පරිච්ඡේදයට වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගනු ලැබේ.

# 3 සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 3.1 ඒකාබද්ධ වීමේ පදනම

(a) අනුබද්ධිත ආයතන

අනුබද්ධිත ආයතන යනු සමූහය මඟින් පාලනය වන ආයතන වේ. පාලනය ආරම්භ කරන ලද දින සිට පාලනය අවසන් වන දින දක්වා අනුබද්ධිත ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන සමූහයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් වේ. සමූහය විසින් යොදාගන්නා ප්‍රතිපත්ති සමඟ ගැලපීම සඳහා අනුබද්ධිත ආයතන වල ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍ය අවස්ථාවලදී වෙනස් කරනු ලැබේ.

(b) ඒකාබද්ධ වීම මත ඉවත් කරනු ලබන ගනුදෙනු

අන්තර්-සමූහ ශේෂයන් සහ ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් පැන නගින කිසියම් උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉවත් කරනු ලැබේ. සමකොටස් ගිණුම්ගත ආයෝජිතයින් සමඟ ගනුදෙනු වලදී පැන නඟින උපලබ්ධි නොවූ ලාභ ආයෝජනයට එරෙහිව ආයෝජිතයාට සමූහයෙහි ඇති කැමැත්තේ ප්‍රමාණයට ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ උපලබ්ධි නොවූ ලාභ ඉවත් කරන ලද අකාරයට සමාන ආකාරයකින් ඉවත් කරනු ලබන නමුත් එසේ සිදු කරනු ලබන්නේ අගය අඩුවීම පිළිබඳ සාක්ෂියක් නොමැති ප්‍රමාණය දක්වා පමණි.

## 3.2 විදේශ මුදල් ගනුදෙනු

ගනුදෙනුව සිදුකරන අවස්ථාවේදී පවතින විනිමය අනුපාතය අනුව සියළු විදේශ විනිමය ගනුදෙනු ක්‍රියාකාරී මුදල් වර්ගයට පරිවර්තනය කරනු ලැබේ. වාර්තාකරණ දිනට පවත්නා ස්ථානීය විනිමය අනුපාතිකය අනුව විදේශ මුදල් වලින් නාමකරණය කරන ලද මූල්‍යමය වත්කම් සහ බැරකම් ක්‍රියාකාරී මුදල් වර්ගයට නැවත පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදල් වර්ගයක පවතින ඓතිහාසික පිරිවැයට අගය කරනු ලබන මුදල්මය නොවන අයිතම මුල් ගනුදෙනු දිනට පවතින විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ. වටිනාකම් නිශ්චය කරනු ලබන අවස්ථාවේදී පැවති විනිමය අනුපාත භාවිතා කරමින් මුදල්මය නොවන වත්කම් සහ බැරකම් පරිවර්තනය කරනු ලැබේ. පරිවර්තන වෙනස ඇතිකරලීම සඳහා හේතු වූ අයිතමයේ ලාභයට හෝ අලාභයට සමගාමීව මුදල්මය නොවන අයිතම පරිවර්තනය කිරීමෙන් පැන නඟින ලාභය හෝ අලාභය හඳුනාගනු ලැබේ.

## 3.3 මූල්‍යමය වත්කම් සහ මූල්‍යමය බැරකම්

### (a) ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය වත්කම්

සමූහය විසින් ආරම්භයේදී ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවායේ ආරම්භක දිනයට හඳුනාගනු ලැබේ.අනිකුත් සියළු මූල්‍ය වත්කම් මෙවලමෙහි කොන්ත්‍රාත්තුගත ප්‍රතිපාදන සදහා පාර්ශවයක් බවට පත්වන වාණිජ දිනට ආරම්භයේදී හඳුනාගනු ලැබේ.

වත්කමෙන් ලැබෙන මූල්‍ය ප්‍රවාහ සඳහා පවතින කොන්ත්‍රාත්තුගත අයිතීන් කල්ඉකුත් වූ විට හෝ මූල්‍යමය වත්කමෙහි අයිතියෙහි සියළුම අවදානම් සහ පරිදානයන් සැලකිය යුතු ප්‍රමාණයකින් පවරනු ලබන ගනුදෙනුවකදී මූල්‍යමය වත්කම පිළිබඳ කොන්ත්‍රාත්තුමය මූල්‍ය ප්‍රවාහයන් ලබාගැනීමේ අයිතීන් පවරන විටදී සමූහය විසින් මූල්‍යමය වත්කම හඳුනා නොගනී. සමූහය විසින් ඇති කරන ලද හෝ රඳවාගනු ලැබූ, පැවරූ මූල්‍යමය වත්කම් වල කිසියම් පොළියක් වෙන් වූ වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ.

ශුද්ධ පදනමින් නිරවුල් කිරීමට හෝ එකවිටම වත්කම් උපලබ්ධිකර බැරකම නිරවුල් කිරීමට හෝ අදහස් කරනු ලබන අගයන් හිලව් කිරීමට සමූහයට නීතිමය අයිතියක් පවතින විටදී සහ එවැනි විටකදී පමණක් මූල්‍යමය වත්කම් සහ බැරකම් හිලව් කරන අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඉදිරිපත් කරනු ලැබේ.

සමූහයට මතු සඳහන් ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය වත්කම් පවතී ; ණය සහ ලැබිය යුතු දෑ සහ විකිණීම සඳහා පවතින මූල්‍යමය වත්කම් .

#### (i) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ, ක්‍රියාකාරී වෙළඳපලක් තුල ප්‍රකාශයට පත් නොකල ස්ථාවර හෝ නිශ්චය කලහැකි ගෙවීම් සහිත මූල්‍යමය වත්කම් වේ. කිසියම් අගය අඩුවීමේ අලාභ අඩුකර ඵලදායී පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ආරම්භක හඳුනාගැනීමට සමගාමීව ණය සහ ලැබිය යුතු දෑ ක්‍රමක්ෂිත පිරිවැයට අගයනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ, මුදල් සහ මුදල් හා සමාන දෑ, සම්බන්ධිත පාර්ශව වලින් ලැබිය යුතු දෑ ඇතුළුව ණයකර සහ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වල ආයෝජන වලින් සමන්විත වේ.

#### (ii) මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑවලට මුදල් ශේෂයන් අඩංගු වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවශ්‍යතාවය සඳහා ඉල්ලුම් කිරීමේදී නැවත ගෙවිය යුතු සහ සමූහයේ මුදල් කළමනාකරණයේ අවශ්‍ය කොටසක් තනන බැංකු අයිරා මුදල් සහ මුදල් හා සමාන දෑවල සංඝටකයක් ලෙස ඇතුලත් කරනු ලැබේ.

#### (iii) විකිණීම සඳහා පවතින මූල්‍යමය වත්කම්

විකිණීම සඳහා පවතින මූල්‍යමය වත්කම්, විකිණීම සඳහා පවතින ලෙස නාමකරණයක කරන ලද සහ වෙනත් කිසිම මූල්‍යමය වත්කමක් ලෙස වර්ගීකරණය නොකල ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය වත්කම් වේ. සමකොටස් සුරැකුම්පත් වල සමූහය විසින් සිදු කර ඇති ආයෝජන විකිණීම සඳහා පවතින මූල්‍යමය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මුල් හඳුනාගැනීමට තදනන්තරව, ඒවා සාධාරණ වටිනාකමට අගයනු ලැබේ, එහි වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගන්නා අතර සාධාරණ වටිනාකම් සංචිතයෙහි සමකොටස් තුල ඉදිරිපත් කරනු ලැබේ. ආයෝජනයක් හඳුනානොගත් විට, වෙනත් විස්තීර්ණ ආදායම් වල සමුච්චිත ලාභය හෝ අලාභය, ලාභයට හෝ අලාභයට මාරු කරනු ලැබේ. කෙසේවෙතත් ක්‍රියාකාරී වෙළඳපළක ප්‍රකාශිත වෙළඳපළ මිලක් නොමැති වීම හේතුවෙන් සාධාරණ වටිනාකම විශ්වාසනීයව මැනිය නොහැකි සමකොටස් මෙවලම් වල ආයෝජන පිරිවැයට අගයනු ලැබේ.

### (b) ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය බැරකම්

සමූහය මෙවලමෙහි කොන්ත්‍රාත්තුමය විධිවිධානයන්ට කොටස්කරුවෙකු වන වෙළඳ දිනට වෙනත් මූල්‍යමය බැරකම් මුලින් හඳුනාගනු ලැබේ. එහි කොන්ත්‍රාත්තුමය බැඳීම් බැහැර කළ විට, අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට සමූහය මූල්‍යමය බැරකමක් හඳුනාගනු නොලැබේ.

සමූහය ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය බැරකම් වෙනත් මූල්‍යමය බැරකම් කාණ්ඩයට වර්ගීකරණය කරනු ලැබේ.එවැනි මූල්‍යමය බැරකම් සාධාරණ අගය එකතු කිරීම ඕනෑම සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට ආරම්භයේදී හඳුනාගනු ලැබේ. මූලික හඳුනාගැනීමට සමගාමීව මෙම මූල්‍යමය බැරකම් ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ.

වෙනත් මූල්‍යමය බැරකම්, ණය සහ අතමාරු, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වලින් සමන්විත වේ.

### පොදු කොටස් ප්‍රාග්ධනය

පොදු කොටස් සම කොටස් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.පොදු කොටස් නිකුත් කිරීමට සෘජුව ආරෝපණය කළ හැකි වර්ධක පිරිවැය, බදු හැර සම කොටස් වලින් අඩු කිරීමක් ලෙස හඳුනාගනු ලැබේ.

## 3.4 අගය අඩු වීම

### 3.4.1 ව්‍යුත්පන්න නොකළ මූල්‍යමය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට ගෙන නොගිය මූල්‍යමය වත්කමක් එහි අගය අඩු වී ඇති බවට පරමාර්ථ සාක්ෂියක් පවතීද යන්න නිශ්චය කර ගැනීම සඳහා එක් එක් වාර්තාකරණ දිනට අගය කරනු ලැබේ. වත්කමෙහි ආරම්භක හඳුනාගැනීමෙන් පසු අලාභ අවස්ථාවක් ඇති වූ බවට සහ එම අලාභ අවස්ථාවට එම වත්කමෙහි අනාගත මුදල් ප්‍රවාහ මත විශ්වාසනීයව ඇස්තමේන්තු කළ හැකි සෘණ බලපෑමක් තිබූ බවට පරමාර්ථ සාක්ෂිය මඟින් පෙන්වා දෙන්නේ නම් මූල්‍ය වත්කමක අගය අඩු වී ඇත.

ණයගැතියෙකු විසින් ණය නොගෙවා පැහැර හැරීම, එසේ නොවේනම්, සමූහය විසින් සළකා නොබලනු ලබන සමූහයට හිඟව පවතින යම් මුදලක් කොන්දේසි මත ප්‍රතිව්‍යුහගත කිරීම, ණයගැතියෙකු හෝ නිකුත් කරන්නෙකු බංකොළොත්භාවයට පත්වන බවට ඇඟවීම් හෝ සුරැකුමක් සඳහා ක්‍රියාකාරී වෙළඳපළක් නොමැති වීම මූල්‍ය වත්කම් අගය අඩු වී ඇති බවට වන පරමාර්ථ සාක්ෂි වලට ඇතුලත් කළ හැකි වේ.ඊට අමතරව, සමකොටස් ඇපකරයක ආයෝජනයක් සඳහා එහි සාධාරණ අගය එහි පිරිවැයට අඩු සැළකිය යුතු හෝ කල් පවතින පහළ යෑම අගය අඩු වීමේ පරමාර්ථ සාක්ෂියක් වේ.

### 3.4.2 මූල්‍යමය වත්කම්

ලැබිය යුතු දෑ සඳහා අගය අඩු වීම පිළිබඳ සාක්ෂි සමූහය විසින් විශේෂිත වත්කම් මට්ටමකින් සළකා බලනු ලැබේ.විශේෂිත අගය අඩුවීම සඳහා සියළු තනි තනි වශයෙන් සැළකිය යුතු ලැබිය යුතු දෑ අගය කරනු ලැබේ.

වත්කමෙහි මුල් ඵලදායි පොළී අනුපාතයට වට්ටම්කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම සහ එහි පවතින වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලබන ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කමක් හා සම්බන්ධ අගය අඩුවීමේ අලාභයක් මනිනු ලැබේ.අලාභ, ලාභ හෝ අලාභවල හඳුනාගන්නා අතර ලැබි යුතු දෑවලට එරෙහිව දීමනා ගිණුමෙහි පිළිබිඹු කරනුලැබේ. අගය අඩු වූ වත්කම මත පොළිය අවසන් නොකළ වට්ටම තුළින් අඛණ්ඩව හඳුනාගනු ලැබේ. සමගාමී සිද්ධියක් හේතුවෙන් අගය අඩුවීමේ අලාභය අඩු වූ විට, අගය අඩුවීමේ අලාභයෙහි සිදු වූ අඩු වීම ලාභ හෝ අලාභය හරහා වෙන් කරනු ලැබේ.

විකිණීම සදහා පවතින ආයෝජන ඇපකරමත අගය අඩුවීමේ අලාභ, වෙනත් විස්තීර්ණ ආදායම් හඳුනාගන්නා ලද සහ සමකොටස්වල සාධාරණ වටිනාකම් වෙන් කිරීම්වල ඉදිරිපත් කර ඇති සමුච්චිත අලාභ, ලාභ හෝ අලාභයට මාරු කිරීමෙන් හඳුනාගනු ලැබේ.  වෙනත් විස්තීර්ණ ආදායම්වලින් ඉවත් කරන ලද සහ ලාභ හෝ අලාභයෙහි හඳුනාගන්නා ලද සමුච්චිත අලාභය, ඕනෑම ප්‍රධාන නැවත ගෙවීමක් සහ ක්‍රමක්ෂය හැර අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ලාභ හෝ අලාභයෙහි පෙර හඳුනාගන්නා ලද ඕනෑම අගය අඩුවීමේ අලාභයක් අඩුකිරීම වර්තමාන සාධාරණ අගය අතර වෙනසයි. කාලික වටිනාකමට ආරෝපණය කළහැකි අගය අඩුවීමේ වෙන්කිරීම්වල වෙනස්වීම් පොළී ආදායම්වල සංඝටකයක් ලෙස පිළිබිඹු කරනු ලැබේ.

### 3.4.3 මූල්‍යමය නොවන වත්කම්

බඩු වට්ටෝරු සහ විලම්භිත බදු වත්කම් හැර සමූහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම්, අගය අඩුවීමක් පිළබඳ කිසියම් ඇඟවීමක් පවතීද යන්න නිශ්චය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනට අගයනු ලැබේ. එවැනි යම් ඇඟවීමක් පවතී නම් එවිට වත්කමෙහි අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ.

වත්කමක හෝ මුදල් උත්පාදනය කරනු ලබන ඒකකයක අයකරගත හැකි වටිනාකම භාවිතා කිරීමේ වටිනාකම සහ එහි සාධාරණ අගය අඩුකල විකිණීම සඳහා වන පිරිවැය යන මෙයින් වැඩි අගය වේ. භාවිතයේ පවතින වටිනාකම අගය කිරීමේදී, මුදලෙහි කාලික අගයෙහි වර්තමාන වෙළඳපළ ඇගයීම් පිළිබිඹු කරන බදු-පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට විශේෂිත අවදානම භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ. අගය අඩු වීම පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සඳහා, වත්කම් වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩ වල මුදල් ගලනයෙන් විශාල වශයෙන් ස්වාධීන වන අඛණ්ඩ භාවිතයෙන් මුදල් උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට එක්ව කාණ්ඩගත කරනු ලැබේ (“මුදල් උත්පාදන ඒකකය”). අගය අඩු වීම පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සඳහා ව්‍යාපාර සංයෝජනයක් විසින් අත්පත්කර ගන්නා ලද කීර්තිනාමය සංයෝජනයෙහි සහක්‍රියා වලින් ප්‍රතිලාභ ලබනු ඇති බවට අපේක්ෂා කරන මුදල් උත්පාදන ඒකක වලට පවරනු ලැබේ.

වත්කමක පවතින වටිනාකම හෝ එහි මුදල් උත්පාදන ඒකකය එහි ඇස්තමේන්තු අයකරගතහැකි වටිනාකම ඉක්මවා යන්නේ නම් අගය අඩු වීමේ අලාභයක් හඳුනාගනු ලැබේ. අගය අඩු වීමේ අලාභ, ලාභ හෝ අලාභයෙහි හඳුනාගනු ලැබේ.

## 3.5 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

### 3.5.1 හඳුනාගැනීම සහ ඇගයීම

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ, පිරිවැය/ප්‍රත්‍යාගණනය අඩුකිරීම සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත අගය අඩුවීමේ අලාභයන්ට වාර්තා කරනු ලැබේ. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි යම් අයිතමයන් සඳහා සංක්‍රමන දිනට සාධාරණ වටිනාකම උපකල්පිත පිරිවැය ලෙස යොදා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) පළමු වරට යොදා ගැනීමේදී SLFRS 1 න් විකල්ප නිදහස් කිරීමක් ඉල්ලීම සඳහා සමූහය තීරණය කරන ලදී. (සටහන 15)

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක පිරිවැය එහි ගත් මිල සහ වත්කමෙන් අදහස් කරන භාවිතය ලබා ගැනීම සඳහා එය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අරෝපණය කල හැකි ඕනෑම සෘජු පිරිවැය වලින් සමන්විත වේ. අමුද්‍රව්‍යය වල පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කමෙන් අදහස් කරන භාවිතය ලබා ගැනීම සඳහා එය ක්‍රියාකාරි තත්ත්වයට ගෙන ඒමට අරෝපණය කල හැකි වෙනත් ඕනෑම පිරිවැය, ස්වයංව තැනුනු වත්කම් වල පිරිවැයට ඇතුලත් වේ. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක කොටස් වලට වෙනස් ප්‍රයෝජ්‍ය ජීව කාල ඇති විටදී, ඒවා දේපල,පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි වෙන්වූ අයිතමයන් (ප්‍රධාන සංඝටක) ලෙස ගිණුම්ගත කරනු ලැබේ

### 3.5.2 කල්බදු වත්කම්

හිමිකාරීත්වයේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසින් සමූහයට පැවරෙන  කල්බදු, මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික හඳුනාගැනීමේදී කල්බදු වත්කම එහි සාධාරණ වටිනාකමට වඩා අඩු සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට සමාන වටිනාකමකට අගය කර ප්‍රාග්ධනිත කරනු ලැබේ. මූලික හඳුනාගැනීමට තදනන්තරව, වත්කම එම වත්කමට අදාල කර ගත හැකි ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ගිණුම්ගත කරනු ලැබේ.

### 3.5.3 තදනන්තර පිරිවැය

කොටස හා බැඳී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ලැබිය හැකි වන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි වන්නේ නම් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක කොටසක් මාරුකිරීමේ පිරිවැය අයිතමයෙහි පවතින වටිනාකමෙහි හඳුනාගනු ලැබේ.  මාරු කල කොටසෙහි පවතින වටිනාකම හඳුනා නොගනී. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි එදිනෙදා සේවා වියදම් දරනු ලැබූවක් ලෙස ලාභ අලාභයෙහි හඳුනාගනු ලැබේ.

### 3.5.4 හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ එහි භාවිතයෙන් හෝ අපහරණයෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. හඳුනා නොගැනීමේ ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභයෙහි වෙනත් ආදායම් තුළ හඳුනාගනු ලැබේ

### 3.5.5 ක්‍රමක්ෂය

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාල ඔස්සේ සරල රේඛීය ක්‍රමය මඟින් ලාභ හෝ අලාභයෙහි ක්‍රමක්ෂය හඳුනාගනු ලැබේ. කල්බදු කාලසීමාව අවසානයේදී සමූහයට හිමිකාරිත්වය ලැබෙන බවට හේතුසාධක සහිතව යම් නිශ්චිත භාවයක් පවතින විටදී හැර කල්බදු වත්කම් කල්බදු කාලසීමාව කෙටි වීම සහ ඒවායේ ප්‍රයෝජ්‍ය කාල ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ. භාවිතය සඳහා යොදාගත හැකිව පවතින විටදී වත්කමක ක්‍රමක්ෂය ආරම්භ වන අතර වත්කම විකිණීමට තබා ඇති (හෝ විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කරන ලද අපහරණ කාණ්ඩයකට ඇතුලත් කර ඇති විට) ලෙස වර්ගීකරණය කල දිනය සහ වත්කම හඳුනානොගන්නා දිනය යන දින දෙකෙන් මුල් දිනයට වත්කමක ක්‍රමක්ෂය අවසන් වේ. සින්නක්කර ඉඩම් සහ සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් මත ක්‍රමක්ෂය  අය නොවේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය පහත පරිදි වේ:

| වත්කම් කාණ්ඩය | ප්‍රයෝජ්‍ය ජීව කාලය |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | වර්ෂ 13.33 |
| කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | වර්ෂ 8 |
| ඉදිකිරීම් මෙවලම් සහ උපකරණ | වර්ෂ 4-5 |
| මෝටර් වාහන | වර්ෂ 4 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර | වර්ෂ 5 |
| කන්ටේනර | වර්ෂ 5 |
| පරිගණක | වර්ෂ 5 |
| පුස්තකාල පොත් | වර්ෂ 8 |

### 3.5.6 සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

වාර්තාකරණ දිනට සම්පූර්ණ නොකල වර්ෂය තුලදී දරන ලද ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර වර්ෂය තුල සම්පූර්ණ කරන ලද සහ භාවිතයට ගත හැකිව පවතින ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ වලට මාරු කර ඇත.

## 3.6 බඩු වට්ටෝරු

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමට අඩුවෙන් බඩු වට්ටෝරු තක්සේරු කරනු ලැබේ. පිරිවැය, බරතැබූ මධ්‍යයන පිරිවැය පදනමින් නිශ්චය කරනු ලබන අතර එයට බඩු වට්ටෝරු අත්පත් කර ගැනීමට සහ ඒවා පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම් ඇතුලත් වේ.

### 3.6.1 සිදු කෙරෙමින් පවතින කාර්යයන්

එදින දක්වා සිදු කරන ලද කොන්ත්‍රාත් කාර්යයන් සඳහා සේවාදායකයින්ගෙන් ලබා ගැනීමට අපේක්ෂිත බිල් නොකල දළ වටිනාකම සිදුකෙරෙමින් පවතින ඉදිකිරීම් කොන්ත්‍රාත් වලින් නියෝජනය වේ. විශේෂිත ව්‍යාපෘති සඳහා සෘජුව සම්බන්ධ වන සියළු වියදම් සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් කරගනිමින් සමූහයේ කොන්ත්‍රාත් කාර්යයන්හි දරන ලද ස්ථාවර සහ විචල්‍ය පොදු කාර්ය පිරිවැය වෙන් කිරීමක් පිරිවැයට ඇතුලත් වේ. දරන ලද පිරිවැය සහ හඳුනාගත් ලාභ එකතු කල විට ප්‍රගති බිල්පත් ඉක්මවන සියළු කොන්ත්‍රාත් සඳහා කෙරෙමින් පවතින ඉදිකිරීම් කොන්ත්‍රාත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ අනෙකුත් ලැබීම්වල කොටසක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ හඳුනාගත් ලාභ එකතු කල විට ලැබෙන අගය ප්‍රගති බිල්පත් ඉක්මවා යන විට, වෙනස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑවල කොටසක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

## 3.7 සේවක ප්‍රතිලාභ

(a) අර්ථ දැක්වූ දායකත්ව සැලසුම්

අර්ථදැක්වූ දායකත්ව සැලසුම පශ්චාත්-රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර එහිදී දායකත්වය වෙනම අරමුදලකට යවනු ලබන අතර වැඩිදුර මුදල් ගෙවීම සඳහා ආයතනයට නීතිමය හෝ අර්ථකාරී බැඳීමක් නොමැත. සේවකයා විසින් සේවය සපයනු ලබන කාලපරිච්ඡේදයේදී අර්ථ දැක්වූ දායකත්ව සැලසුමට දායකත්වය දැක්වීම සඳහා වන බැඳීම් සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස ලාභ හෝ අලාභයෙහිහඳුනාගනු ලැබේ. අනාගත ගෙවීම් වල මුදල් නැවත ගෙවීමක් හෝ අඩුකිරීමක් පවතින ප්‍රමාණයට පෙරගෙවුම් දායකත්වයන් වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ.

(a) අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් (ඉදිරියට)

**අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල**

සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්ති භාරකාර අරමුදලේ දායකත්වය සඳහා සුදුසුකම් සහිත සියළුම සේවකයින් අදාල නීති සහ රෙගුලාසි වලට අනුකූලව අදාල දායකත්ව අරමුදල් මඟින් ආවරණය වේ. සමූහය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්ති භාරකාර අරමුදලට සේවකයාගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% ක දායකත්වයක් දක්වනු ලැබේ.

(b) අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත් බැරකම වාර්තාකරණ දිනට අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකමවේ. සේවක ප්‍රතිලාභ- LKAS 19 මඟින් නිර්දේශ කර ඇති ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය (PUC) භාවිතා කරමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම ස්වාධීන ආයුගණකවරුන් විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ.අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් සඳහා ආයුගණක ලාභ සහ අලාභ ඒවා සිදු වූ කාලපරිච්ඡේදයේදී වෙනත් විස්තීර්ණ ආදායම්වල සම්පූර්ණයෙන් හඳුනාගනු ලැබේ.

අවම වශයෙන් වර්ෂ තුනකට වරක් ආයුගණක තක්සේරු කිරීම් සිදු කිරීමට සමූහය අපේක්ෂා කරයි.

අර්ථ දැක්වූ බැඳීමේ වර්තමාන වටිනාකම ලබා ගැනීම සඳහා අවශ්‍ය උපකල්පන සළකා බලමින් පාරිතෝෂික බැරකම ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය (PUC) භාවිතා කරමින් අගය කරනු ලැබේ.

කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනත ප්‍රකාරව වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකු සඳහා පාරිතෝෂික බැරකම පැන නගී.

## 3.8 වෙන් කිරීම්

පසුගිය ක්‍රියාවක ප්‍රතිඵලයක් හේතුවෙන් විශ්වාසනීයව ඇස්තමේන්තු කල හැකි වර්තමාන නීතිමය හෝ අර්ථකාරී බැඳීමක් සමූහයට පවතින්නේ නම් සහ එම බැඳීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගැලීමක් අවශ්‍ය වනු ඇති බව පෙනී යන්නේ නම් වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම් සහ බැරකම් ශේෂ පත්‍රයෙහි හඳුනාගනු ලැබේ. මුදලෙහි කාලික අගයෙහි වර්තමාන වෙළඳපළ ඇගයීම පිළිබිඹු කරන බදු-පෙර වට්ටම් අනුපාතයකට සහ බැරකමට විශේෂිත අවදානම භාවිතා කරමින් අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමෙන් වෙන්කිරීම් නිශ්චය කරනු ලැබේ. අවසන් කළ නොහැකි වට්ටම් කිරීම මූල්‍යමය පිරිවැයක් ලෙස හඳුනාගනු ලැබේ.

## 3.9 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

### 3.9.1 ආදායම

(a) ඉදිකිරීම් කොන්ත්‍රාත්

කොන්ත්‍රාත්තුව සඳහා ආරම්භයේදී එකඟ වූ මුදල එකතු කිරීම ඒවා ආදායමක් ලබා දෙනු ඇති බවට සහ විශ්වාසනීයව මැනිය හැකි වන බව පෙනී යන ප්‍රමාණයට කොන්ත්‍රාත් කාර්යය, හිමිකම්පෑම් සහ ප්‍රසාද දීමනා ගෙවීම්වල යම් වෙනස්කමක් කොන්ත්‍රාත් ආදායමට ඇතුලත් වේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක ප්‍රතිඵලය විශ්වාසනීයව ඇස්තමේන්තු කල හැකි වන වහාම, කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර ඇති අදියරට සමානුපාතිකව කොන්ත්‍රාත් ආදායම ලාභ හෝ අලාභයෙහි හඳුනාගනු ලැබේ.

එදිනට සිදු කර ඇති කාර්ය සඳහා දරා ඇති කොන්ත්‍රාත් පිරිවැය, ඇස්තමේන්තුගත මුළු කොන්ත්‍රාත් පිරිවැයට දරන අනුපාතයට අනුව සම්පූර්ණ කර ඇති අදියර අගයනු ලැබේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක ප්‍රතිඵලය විශ්වාසනීයව ඇස්තමේන්තු කල නොහැකි වූ විට, දරන ලද කොන්ත්‍රාත් පිරිවැය නැවත අයකර ගත හැකි ප්‍රමාණය දක්වා පමණක් කොන්ත්‍රාත් ආදායම හඳුනාගනු ලැබේ.

(b) උපදේශන සේවාවන්

ඉදිකිරීම් කාර්යන් ආශ්‍රිත උපදේශන සේවා සැපයීමෙන් සමූහය ආදායම් උත්පාදනය කරනු ලැබේ. වාර්තාකරණ දිනට ගනුදෙනුවේ අදියරට සමානුපාතිකව උපදේශන සේවාවලින් ලැබෙන ආදායම ලාභ හෝ අලාභයෙහි හඳුනාගනු ලැබේ. සම්පූර්ණ කර ඇති අදියර සිදු කර ඇති කාර්යය මැනීමෙන් අගයනු ලැබේ.

### 3.9.2 පොළී ආදායම

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන සියළු මූල්‍ය මෙවලම් සහ විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කල පොළියක් දරන මූල්‍යමය වත්කම් සඳහා ඵලදායී පොළී ක්‍රමවේදය (EIR) එනම් මූල්‍ය මෙවලමෙහි අපේක්ෂිත ආයු කාලය හෝ ඊට අඩු කාලපරිච්ඡේදයක් ඔස්සේ හෝ යෝග්‍ය අවස්ථාවලදී මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ පවතින වටිනාකමට අනාගත මුදල් ලැබීම් හෝ ගෙවීම් සත්‍ය වශයෙන්ම වට්ටම්ගත කරනු ලබන පොළී අනුපාතය භාවිතා කරමින් පොළී ආදායම හෝ වියදම වාර්තා කරනු ලැබේ. පොළී ආදායම,විස්තීර්ණ ආදායම් ආදායම් ප්‍රකාශනයෙහි මූල්‍ය ආදායමට ඇතුලත් කරනු ලැබේ.

### 3.9.3 ලාභාංශ ආදායම

ගෙවීමක් ලැබීමට ඇති කොටස් හිමියන්ගේ අයිතිය තහවුරු කල විට ලාභාංශ ආදායම් ගිණුම්ගත කරනු ලැබේ.

### 3.9.4 වෙනත් ආදායම්

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැර කිරීමේ ලාභ හෝ අලාභ, බැහැර කිරීමෙන් ලබන මුදල්, වත්කම්වල පවතින වටිනාකම සහ සම්බන්ධිත වියදම් අඩුකිරීමෙන් පසුව හඳුනාගනු ලැබේ.

විදේශ විනිමය ලාභ සහ අලාභ ශුද්ධ පදනමින් වාර්තාකරනු ලැබේ.

### 3.9.5 වියදම හඳුනාගැනීම

(a) ඉදිකිරීම් සහ උපදේශන පිරිවැය

අනාගත කොන්ත්‍රාත් ක්‍රියාකාරීත්වයකට සම්බන්ධ වත්කමක් උත්පාදනය කිරීමේදී හැර කොන්ත්‍රාත් වියදම් දැරීමක් ලෙස හඳුනාගනු ලැබේ. ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා වන මුළු පිරිවැය එහි ආදායමට ඉක්මවා ඇති බවට අදහස් කරන විටදී අපේක්ෂිත අලාභ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

(b) වෙනත් වියදම්

වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය කරගෙන යෑමේ සහ දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ කාර්යක්ෂම අයුරින් නඩත්තු කිරීමෙහි දරන ලද සියළු වියදම් ආදායමට එක් කර ඇත

### 3.9.6 බදුකරණය

(a) වර්තමාන බදු

වර්තමාන සහ පෙර කාලපරිච්ඡේද සඳහා වන වර්තමාන ආදායම් බදු බැරකම් අයකරගත හැකි වන බවට අපේක්ෂිත හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවන ලද ප්‍රමාණයට අගයනු ලැබේ. එම ප්‍රමාණය ගණනය කිරීමේදී යොදා ගන්නා ලද බදු අනුපාත සහ බදු නීති පනවා ඇති හෝ වාර්තාකරණ දිනට නිත්‍ය වශයෙන් පනවා ඇති ඒවා වේ.

ආදායම් බදු සඳහා වෙන් කිරීම්, මූල්‍ය ප්‍රකාශන වල වාර්තාකර ඇති ආදායම් සහ වියදම් වල මූලාවයව මත පදනම්ව සහ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව ගණනය කර ඇත.

සබැඳි විස්තර අදාල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වල අනාවරණය කර ඇත.

(b) විලම්භිත බදු

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවය සඳහා වත්කම් සහ බැරකම්වල පවතින වටිනාකම් සහ බදුකරණ අවශ්‍යතා සඳහා යොදාගන්නා ලද වටිනාකම් අතර තාවකාලික වෙනස්කම් වලට අදාලව විලම්භිත බදු හඳුනාගනු ලැබේ. පහත සඳහන් දෑ සඳහා විලම්භිත බදු හඳුනානොගනී:

- ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුමකරණ හෝ බදු අයකල හැකි ලාභයට හෝ අලාභයට බලපෑම් ඇති නොකරන ගනුදෙනුවකදී වත්කම් හෝ බැරකම්වල ආරම්භක හඳුනාගැනීම මත තාවකාලික වෙනස්කම්;
- නුදුරු අනාගතයේදී ප්‍රතිවර්ත නොවනු ඇති බවට අදහස් කරනු ලබන ප්‍රමාණයට අනුබද්ධිත ආයතන සහ හවුල්ව පාලනය කරන ආයතන වල ආයෝජනයන් හා සබැඳි තාවකාලික වෙනස්කම්; සහ
- කීර්තිනාමය ආරම්භයේදී හඳුනාගැනීම මත පැන නඟින බදු අයකල හැකි තාවකාලික වෙනස්කම්.

වාර්තාකරණ දිනට පනවා ඇති හෝ නිත්‍ය වශයෙන් පනවා ඇති නීති පදනම් කර ගනිමින් ඒවා ප්‍රතිවර්ත වනවිට තාවකාලික වෙනස්කම් වලට යොදාගත හැකි යැයි අපේක්ෂිත බදු අනුපාතයට විලම්භිත බදු අගයනු ලැබේ

## 4. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 7 - මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන, අනුව වක්‍ර ක්‍රමවේදය භාවිතා කිරීමෙන් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත.

## 5. වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසුව සිදු වන සිදු වීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් දිනය අතර සිදුවන හිතකර හෝ අහිතකර සිදුවීම් වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම් වේ.

වාර්තාකරණ දින පසුව සිදුවන සිදුවීම් වල වැදගත්භාවය සළකා බලනු ලබන අතර සුදුසු ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය තැන්වලදී මූල්‍ය ප්‍රකාශන වල සිදු කරනු ලැබේ.

## 6. වාර්තාකරණ දිනට බලාත්මක නොවන නමුත් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිත

සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන ලද දිනට බලාත්මක නොවන නමුත් නිකුත් කර ඇති ප්‍රමිතීන් සහ අර්ථ දැක්වීම් පහත විස්තර කර ඇත. යොදා ගත යුතු නම්, ඒවා බලාත්මක වූ විට මෙම ප්‍රමිතයන් අදාළ කර ගැනීමට සමූහය අදහස් කරයි.

### (i) SLFRS 09 - මූල්‍යමය උපකරණ

බණී 39 හි අර්ථ දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් සහ බැරකම් වර්ගීකරණය හා මැනීම සඳහා අදාල වන LKAS 39 හි ප්‍රතිස්ථාපනය වීම SLFRS 9 නිකුත් කිරීම මගින් පිළිබිඹු කරයි. 2018.01.01 දිනට හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදය සඳහා මෙම ප්‍රමිතය බලාත්මක වේ. SLFRS 9 අදාල කර ගැනීම සමාගමේ සහ සමූහයේ මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මැනීම මත බලපෑමක් ඇති කරනු ඇත.

### (ii) SLFRS 15 - සේවාදායකයන් සමඟ කොන්ත්‍රාත්වලින් ආදායම් ලැබීම්

කොපමණ ප්‍රමාණයක්ද සහ කවර වේලාවටද යන්න නිශ්චය කිරීම සඳහා SLFRS - 15 මගින් විස්තීර්ණ රාමුවක් ස්ථාපිත කෙරේ.එමගින් පවතින ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශ LKAS 18 "ආදායම", LKAS 11 "ඉදිකිරීම් කොන්ත්‍රාත්" ප්‍රතිස්ථාපනය කෙරේ. කලින් යොදා ගැනීමේ අවසරය සමඟ 2018.01.01 දිනට හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදය සඳහා SLFRS 15 බලාත්මක වේ.

මෙම ප්‍රමිතීන් බලාත්මක වනවිට සමූහය ඒවා යොදා ගනු ඇත. සවිස්තරාත්මක සමාලෝචනයක් දක්වන තුරු, මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කළ දිනට මූල්‍යමය බලපෑම සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැකිය.

















# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

### විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සමූහය 2015 රු. | සමූහය 2014 රු. ප්‍රතිප්‍රකාශිත | මඉඋකා 2015 රු. | මඉඋකා 2014 රු. ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|
| **ආදායම** | 9 | **11,423,636,967** | 13,401,582,667 | **10,710,472,734** | 13,259,699,366 |
| විකුණුම් පිරිවැය | 10 | **(9,679,902,097)** | (11,487,873,150) | **(9,448,860,733)** | (11,656,600,792) |
| **දළ ලාභය** | | **1,743,734,870** | 1,913,709,517 | **1,261,612,002** | 1,603,098,574 |
| **වෙනත් ආදායම** | 11 | **168,515,920** | 147,476,316 | **173,393,789** | 169,674,146 |
| පරිපාලන වියදම් | | **(1,128,975,590)** | (1,189,348,793) | **(759,749,098)** | (1,033,810,083) |
| විකුණුම් සහ බෙදාහරීම් වියදම් | | **(222,249,855)** | (314,175,035) | **(220,503,209)** | (314,175,035) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබීම්** | | **561,025,344** | 557,662,005 | **454,753,483** | 424,787,602 |
| මූල්‍ය ආදායම | | **168,766,491** | 154,451,475 | **150,007,977** | 145,235,138 |
| මූල්‍ය වියදම | | **(16,207,048)** | (27,890,447) | **(8,789,218)** | (17,589,492) |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | 12 | **152,559,443** | 126,561,028 | **141,218,758** | 127,645,646 |
| **ආදායම් බදු පෙර ලාභය** | | **713,584,787** | 684,223,033 | **595,972,241** | 552,433,247 |
| ආදායම් බදු වියදම් | 14 | **(287,358,436)** | (271,949,391) | **(250,935,705)** | (243,267,389) |
| **වර්ෂය සඳහා ලාභ/(අලාභ)** | | **426,226,351** | 412,273,642 | **345,036,536** | 309,165,858 |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්** | | **-** | - | **-** | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **426,226,351** | 412,273,642 | **345,036,536** | 309,165,858 |

වරහන් තුළ ඇති අගයන්ගෙන් අඩු කිරීම් නිරූපණය කෙරේ.

පිටු අංක 28 සිට 35 දක්වා පිටු වල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 වැනි දිනට | | සමූහය | | මඉළකා | |
|---|---|---|---|---|---|
| | | 2015 | 2014 | 2015 | 2014 |
| | | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | **සටහන** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 15 | **3,088,678,195** | 3,298,246,727 | **2,686,829,682** | 2,896,020,996 |
| ආයෝජන | 16 | **39,477,863** | 34,521,663 | **44,253,587** | 44,521,683 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 3,128,156,058 | 3,332,768,390 | **2,731,083,269** | 2,940,542,679 |
| **ජංගම වත්කම්** | | | | | |
| ඉන්වෙන්ටරි | 17 | **594,682,065** | 661,739,053 | **92,491,334** | 320,879,617 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ | 18 | **8,937,778,990** | 8,582,269,469 | **9,443,009,085** | 9,581,357,319 |
| කෙටි කාලීන ආයෝජන | 16 | **3,341,850,862** | 2,753,124,096 | **2,570,978,949** | 2,457,313,968 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 20 | **801,392,970** | 620,947,793 | **622,427,835** | 449,363,357 |
| අන්තර් සමාගම් ජංගම ගිණුම් | 19 | - | - | **1,147,466,029** | 1,278,026,970 |
| **මුළු ජංගම වත්කම්** | | 13,675,704,887 | 12,618,080,411 | **13,876,373,232** | 14,086,941,231 |
| **මුළු වත්කම්** | | 16,803,860,945 | 15,950,848,801 | **16,607,456,501** | 17,027,483,910 |
| **සමකොටස් සහ බැරකම්** | | | | | |
| දායක ප්‍රාග්ධනය | | **500,000** | 500,000 | **500,000** | 500,000 |
| ප්‍රාග්ධන සංචිත | | **3,028,000** | 3,028,000 | **3,028,000** | 3,028,000 |
| රඳවාගත් ඉපැයීම | | **4,952,476,935** | 4,526,250,584 | **4,744,367,819** | 4,399,331,283 |
| **මුළු සමකොටස්** | | 4,956,004,935 | 4,529,778,584 | **4,747,895,819** | 4,402,859,283 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| කල්බදු ණය හිමියන් | 21 | **-** | 888,699 | **-** | - |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 22 | **177,457,833** | 182,165,317 | **176,438,911** | 182,165,317 |
| විලම්භිත බදු | 23 | **17,617,814** | 6,477,006 | **-** | - |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **195,075,647** | 189,531,022 | **176,438,911** | 182,165,317 |
| **ජංගම බැරකම්** | | | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 24 | **10,877,454,823** | 10,485,704,301 | **10,931,756,058** | 11,724,834,406 |
| ගෙවිය යුතු ආදායම් බදු | 25 | **774,441,714** | 737,897,410 | **751,365,710** | 717,039,064 |
| කල්බදු ණය හිමියන් | 21 | **883,827** | 7,937,483 | | 585,840 |
| අන්තර් පාදක ජංගම ගිණුම් | | | | | |
| අන්තර් සමාගම් ජංගම ගිණුම් | 26 | | | | |
| බැංකු අයිරා | 20 | | | | |
| **මුළු ජංගම බැරකම්** | | 11,652,780,363 | 11,231,539,196 | **11,683,121,770** | 12,442,459,310 |
| **මුළු ජංගම බැරකම්** | | 11,847,856,010 | 11,421,070,218 | **11,859,560,681** | 12,624,624,627 |
| **මුළු ජංගම බැරකම්** | | 16,803,860,945 | 15,950,848,801 | **16,607,456,501** | 17,027,483,910 |

වරහන් තුළ ඇති අගයන්ගෙන් අඩු කිරීම් නිරූපණය කෙරේ.

පිටු අංක 28 සිට 35 දක්වා පිටු වල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

පොදුවේ පිළිගන්නා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව සහතික කරමි.

යූ.එන්.බී.මාවතගම
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සහ සඳහා අනුමත කර අත්සන් කරමි;

ඉංජි ජී ඩී ඒ පියතිලක
**සභාපති**

එම් ආර් ජී රණතුංග
**අධ්‍යක්ෂ**

2017 ජනවාරි 26
කොළඹ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය 2015 රු. | සමූහය 2014 රු. | මඉඋකා 2015 රු. | මඉඋකා 2014 රු. |
|---|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | | | | |
| බදු පෙර ලාභය | **713,584,787** | 684,223,033 | **595,972,241** | 552,433,247 |
| **ගැලපීම්:** | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල ක්‍රමක්ෂය | **427,194,180** | 431,739,029 | **270,578,458** | 328,077,547 |
| බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම | **243,149,506** | 308,872,386 | **239,395,936** | 308,872,386 |
| බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රත්‍යාවර්තනය | **(67,849,238)** | (52,969,199) | **(66,248,516)** | (52,969,199) |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම්/(ප්‍රත්‍යාවර්තනය) | **19,492,872** | 15,117,495 | **18,473,950** | 15,117,495 |
| ශුද්ධ මූල්‍ය ආදායම | **(152,559,447)** | (126,561,028) | **(141,218,758)** | (127,645,645) |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැර කිරීමේ (ලාභ)/අලාභ | **(913,314)** | 728,679 | **(993,769)** | 728,680 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීමවලට පෙර මෙහෙයුම් ලාභය** | 1,182,099,347 | 1,261,150,395 | **915,959,542** | 1,024,614,512 |
| බදු වට්ටෝරු (වැඩිවීම)/අඩුවීම | **67,056,988** | 85,083,263 | **228,388,283** | 93,451,892 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ (වැඩිවීම)/අඩුවීම | **(530,809,789)** | 4,196,101,067 | **(34,799,186)** | (371,813,692) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ (වැඩිවීම)/අඩුවීම | **391,750,522** | (3,965,989,760) | **(793,078,348)** | 391,542,452 |
| සම්බන්ධිත සමාගම්වලට හිගව පවතින මුදල් වැඩිවීම/(අඩුවීම) | **-** | - | **130,560,941** | (194,991,669) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල්** | 1,110,097,071 | 1,576,344,965 | **447,031,230** | 942,803,494 |
| ගෙවන ලද පොළී | **(16,207,044)** | (27,890,447) | **(8,789,218)** | (17,589,493) |
| ගෙවන ලද බදු | **(239,673,323)** | (74,775,998) | **(216,609,058)** | (57,339,754) |
| ගෙවන ලද පාරිතෝෂික | **(24,200,356)** | (36,957,075) | **(24,200,356)** | (36,957,075) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | 830,016,348 | 1,436,721,444 | **197,432,598** | 830,917,172 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය** | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල ආයෝජන | **(234,793,003)** | (365,286,891) | **(61,687,770)** | (90,546,698) |
| සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් වල ආයෝජන | **(1,000,000)** | (2,571,990) | **-** | - |
| දේපල,පිරියත සහ යන්ත්‍රෝපකරණ බැහැර කිරීම මත විකුණුම් ලැබීම් | **19,080,663** | - | **1,294,397** | - |
| දීර්ඝ කාලීන තැන්පතු ආයෝජන/බැහැරකිරීම | **(4,956,200)** | 3,804,734 | **268,097** | (6,195,266) |
| කෙටි කාලීන තැන්පතු ආයෝජන/බැහැරකිරීම | **(588,726,766)** | (983,864,676) | **(113,664,981)** | (728,732,071) |
| ආයෝජන ආදායම | **168,766,491** | 154,451,475 | **150,007,977** | 145,235,138 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | (641,628,816) | (1,193,467,346) | **(23,782,280)** | (680,238,897) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රවාහය** | | | | |
| මූල්‍ය කල්බදු බැරකම් ගෙවීම | **(7,942,355)** | (21,742,155) | **(585,840)** | (11,668,598) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | (7,942,355) | (21,742,155) | **(585,840)** | (11,668,598) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **180,445,177** | 221,511,942 | **173,064,478** | 139,009,678 |
| ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | **620,947,793** | 399,435,851 | **449,363,357** | 310,353,679 |
| **අවසානයේදී මුදල් හා සමාන දෑ (සටහන 20)** | 801,392,970 | 620,947,793 | **622,427,835** | 449,363,357 |

වරහන් තුළ ඇති අගයන්ගෙන් අඩු කිරීම් නිරූපණය කෙරේ

පිටු අංක 28 සිට 35 දක්වා පිටු වල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

# සමකොටස් වෙනස් වීමේ ප්‍රකාශනය

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | මූලධන | | | |
|---|---|---|---|---|
| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | රඳවාගත් ඉපැයීම් | එකතුව |
| | රු. | රු. | රු. | රු. |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 500,000 | 3,028,000 | 4,090,165,425 | 4,093,693,425 |
| වර්ෂය සඳහා ප්‍රතිප්‍රකාශිත ශුද්ධ ලාභය | - | | 309,165,858 | 309,165,858 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | - | - |
| 2014 දෙසැම්බර් 31 දිනය ශේෂය | 500,000 | 3,028,000 | 4,399,331,283 | 4,402,859,283 |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | **500,000** | **3,028,000** | **4,399,331,283** | **4,402,859,283** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 345,036,536 | 345,036,536 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - |
| | **500,000** | **3,028,000** | **4,744,367,819** | **4,747,895,819** |

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය | | | |
|---|---|---|---|---|
| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | රඳවාගත් ඉපැයීම් | එකතුව |
| | Rs. | Rs. | Rs. | Rs. |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 500,000 | 3,028,000 | 4,113,976,942 | 4,117,504,942 |
| වර්ෂය සඳහා ප්‍රතිප්‍රකාශිත ලාභය | | | 412,273,642 | 412,273,642 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | - | - |
| 2014 දෙසැම්බර් 31 දිනය ශේෂය | 500,000 | 3,028,000 | 4,526,250,584 | 4,529,778,584 |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | **500,000** | **3,028,000** | **4,526,250,584** | **4,529,778,584** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 426,226,351 | 426,226,351 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | - |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | **500,000** | **3,028,000** | **4,952,476,935** | **4,956,004,935** |

පිටු අංක 28 සිට 35 දක්වා පිටු වල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කොටසකි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය 2015 රු. | සමූහය 2014 රු. | මඉළකා 2015 රු. | මඉළකා 2014 රු. |
|---|---|---|---|---|
| **9 ආදායම** | | | | |
| ඉදිකිරීම් ආදායම | **9,457,853,907** | 11,273,975,233 | **8,734,403,246** | 11,127,444,260 |
| උපදේශන ආදායම | **1,965,783,059** | 2,127,607,434 | **1,976,069,488** | 2,132,255,106 |
| | **11,423,636,967** | 13,401,582,667 | **10,710,472,734** | 13,259,699,366 |
| **10 විකුණුම් පිරිවැය** | | | | |
| ඉදිකිරීම් පිරිවැය | **8,332,292,766** | 10,132,060,118 | **8,078,502,315** | 10,284,412,205 |
| උපදේශන පිරිවැය | **1,347,609,331** | 1,355,813,032 | **1,370,358,418** | 1,372,188,587 |
| | **9,679,902,097** | 11,487,873,150 | **9,448,860,733** | 11,656,600,792 |
| **11 වෙනත් ආදායම්** | | | | |
| විවිධ ආදායම් | **77,168,913** | 75,739,607 | **54,141,541** | 86,954,644 |
| කුලියට දීමේ ආදායම් | **12,136,776** | 5,611,316 | **4,348,474** | |
| ස්ථාවර වත්කම් විකිණීමේ ලාභ | **1,047,791** | | **1,047,791** | |
| ප්‍රතිපූර්ණය කළහැකි පිරිවැය | **9,399,663** | 11,400,998 | **46,693,928** | 29,730,614 |
| විදේශ ලාභ හෝ අලාභ | **913,540** | 19,689 | **913,540** | 19,689 |
| බොල් ණය වෙන්කිරීම් ප්‍රත්‍යාවර්තනය | **67,849,238** | 52,969,199 | **66,248,516** | 52,969,199 |
| කොමිස් ආදායම් | **-** | 1,735,507 | **-** | |
| | **168,515,920** | 147,476,316 | **173,393,789** | 169,674,146 |
| **12 ශුද්ධ මූල්‍ය ආදායම්** | | | | |
| **මූල්‍ය ආදායම්** | | | | |
| පොළී ආදායම් | **168,766,491** | 154,451,475 | **150,007,977** | 145,235,138 |
| | **168,766,491** | 154,451,475 | **150,007,977** | 145,235,138 |
| **මූල්‍ය පිරිවැය** | (16,207,044) | (27,890,447) | **(8,789,218)** | (17,589,492) |
| **ශුද්ධ මූල්‍ය ආදායම්** | 152,559,447 | 126,561,028 | **141,218,758** | 127,645,646 |
| **14 ආදායම් බදු** | | | | |
| **14.1** වර්තමාන බදු වියදම් | **276,217,628** | 265,700,526 | **250,935,705** | 243,267,389 |
| විලම්භිත බදු වියදම් | **11,140,808** | 6,248,865 | **-** | - |
| | **287,358,436** | 271,949,391 | **250,935,705** | 243,267,389 |
| **14.2** ගිණුම්කරණ ලාභය බදුකරණ ලාභයට සැසඳීම | | | | |
| ඉදිකිරීම ආදායම මත බදු @ 12% | **63,597,714** | 55,814,491 | **27,174,983** | 27,132,489 |
| වෙනත් ආදායම් මත බදු @ 28% | **105,876,473** | 101,282,089 | **105,876,473** | 101,282,089 |
| විලම්භිත බදු | **117,884,249** | 114,852,811 | **117,884,249** | 114,852,811 |
| වර්තමාන ආදායම් බදු වියදම් | **287,358,436** | 271,949,391 | **250,935,705** | 243,267,389 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට)

15. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

15.1 මිළදී ගැනුම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | ඉඩම් Rs. | ගොඩනැගිලි Rs. | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් Rs. | ඉදිකිරීම් මෙවලම් සහ උපකරණ Rs. | කාර්යාල උපකරණ Rs. | පිරියත සහ යන්ත්‍රසූත්‍ර Rs. | කන්ටේනර් Rs. | පරිගණක Rs. | මෝටර් වාහන Rs. | පුස්තකාල පොත් Rs. | කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් Rs. | එකතුව Rs. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | | | | | |
| 2015 ජනවාරි 1 දිනට ශේෂය | 1,701,736,867 | 818,776,397 | 57,578,529 | 199,505,672 | 61,030,337 | 491,588,587 | 12,380,896 | 118,929,500 | 381,612,012 | 1,479,368 | 19,331,449 | 3,863,949,614 |
| වර්ෂය තුල එකතු කිරීම් | - | - | 6,460,825 | 17,504,658 | 8,273,302 | 12,468,132 | - | 13,557,179 | 3,170,000 | 253,673 | - | 61,687,770 |
| වර්ෂය තුල බැහැර කිරීම් / කපා හැරීම් | - | - | (64,977) | (36,846) | (216,333) | (347,189) | - | (678,286) | - | - | - | (1,343,631) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,701,736,867** | **818,776,397** | **63,974,376** | **216,973,485** | **69,087,306** | **503,709,530** | **12,380,896** | **131,808,393** | **384,782,012** | **1,733,041** | **19,331,449** | **3,924,293,752** |
| **සමුච්චිත ක්‍ෂයවීම** | | | | | | | | | | | | |
| 2015 ජනවාරි 1 දිනට ශේෂය | - | 171,716,650 | 20,807,842 | 118,357,898 | 24,123,665 | 230,044,954 | 8,173,107 | 63,208,256 | 330,888,305 | 607,936 | - | 967,928,613 |
| වර්ෂය තුල එකතු කිරීම් | - | 66,101,019 | 8,416,072 | 39,513,574 | 9,601,341 | 85,835,062 | 2,476,179 | 24,784,632 | 33,651,382 | 199,197 | - | 270,578,458 |
| වර්ෂය තුල බැහැර කිරීම් / කපා හැරීම් | - | - | (32,489) | (29,477) | (152,760) | (277,751) | - | (550,527) | - | - | - | (1,043,003) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **237,817,669** | **29,191,425** | **157,841,995** | **33,572,246** | **315,602,265** | **10,649,286** | **87,442,361** | **364,539,687** | **807,133** | **-** | **1,237,464,072** |
| ශුද්ධ පොත් අගය | | | | | | | | | | | | |
| **2015 ජනවාරි 1 දිනට ශේෂය** | 1,701,736,867 | 647,059,747 | 36,770,687 | 81,147,774 | 36,906,672 | 261,543,633 | 4,207,787 | 55,721,244 | 50,723,707 | 871,432 | 19,331,449 | 2,896,020,994 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,701,736,867** | **580,958,728** | **34,782,951** | **59,131,489** | **35,515,060** | **188,107,265** | **1,731,610** | **44,366,032** | **20,242,325** | **925,908** | **19,331,449** | **2,686,829,682** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට)

## 15. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

### 15.2 සමූහය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | ඉඩම් රු. | ගොඩනැගිලි රු. | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් රු. | ඉදිකිරීම් මෙවලම් සහ උපකරණ රු. | කාර්යාල උපකරණ රු. | පිරියත සහ යන්ත්‍රසූත්‍ර රු. | කන්ටේනර රු. | පරිගණක රු. | මෝටර් වාහන රු. | පුස්තකාල පොත් රු. | කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | | | | | |
| 2015 ජනවාරි 1 දිනට ශේෂය | 1,710,152,014 | 868,308,713 | 66,576,332 | 269,796,240 | 70,698,716 | 637,340,952 | 22,809,362 | 134,249,216 | 699,201,842 | 1,479,368 | 30,237,106 | 4,510,849,861 |
| වර්ෂය තුල එකතු කිරීම් | - | 2,839,187 | 10,641,436 | 48,848,974 | 13,128,530 | 63,867,583 | - | 21,914,581 | 73,217,089 | 335,623 | 1,000,000 | 235,793,003 |
| වර්ෂය තුල බැහැර කිරීම් / කපා හැරීම් | - | - | (64,977) | (36,846) | (216,333) | (24,662,189) | - | (678,286) | - | - | (786,276) | (26,444,907) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,710,152,014** | **871,147,900** | **77,152,791** | **318,608,368** | **83,610,913** | **676,546,346** | **22,809,362** | **155,485,511** | **772,418,931** | **1,814,991** | **30,450,830** | **4,720,197,957** |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | | | | | | | | | | | |
| 2015 ජනවාරි 1 දිනට ශේෂය | - | 180,508,053 | 22,485,019 | 133,788,961 | 26,373,109 | 257,083,642 | 10,694,386 | 67,615,747 | 513,446,277 | 607,936 | - | 1,212,603,130 |
| වර්ෂය තුල එකතු කිරීම් | - | 69,904,618 | 9,803,563 | 61,282,448 | 11,592,409 | 119,497,200 | 4,561,872 | 28,939,477 | 121,408,010 | 204,584 | - | 427,194,180 |
| වර්ෂය තුල බැහැර කිරීම් / කපා හැරීම් | - | - | (32,489) | (29,477) | (152,760) | (7,512,296) | - | (550,527) | - | - | - | (8,277,548) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **250,412,671** | **32,256,093** | **195,041,932** | **37,812,757** | **369,068,546** | **15,256,258** | **96,004,697** | **634,854,287** | **812,520** | **-** | **1,631,519,762** |
| ශුද්ධ පොත් අගය | | | | | | | | | | | | |
| **2015 ජනවාරි 1 දිනට ශේෂය** | 1,710,152,014 | 687,800,660 | 44,091,313 | 136,007,279 | 44,325,607 | 380,257,310 | 12,114,976 | 66,633,469 | 185,755,565 | 871,432 | 30,237,106 | 3,298,246,731 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,710,152,014** | **620,735,229** | **44,896,698** | **123,566,436** | **45,798,155** | **307,477,800** | **7,553,104** | **59,480,814** | **137,564,645** | **1,002,472** | **30,450,830** | **3,088,678,195** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට)

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය | | මඉඋකා | |
|---|---|---|---|---|---|
| | | 2015 | 2014 | 2015 | 2014 |
| | | රු. | රු. | රු. | රු. |
| 16 | **ආයෝජන** | | | | |
| | දීර්ඝ කාලීන ආයෝජන (සටහන 16.1) | 39,477,863 | 34,521,663 | 44,253,587 | 44,521,683 |
| | කෙටි කාලීන ආයෝජන (සටහන 16.2) | 3,341,850,862 | 2,753,124,096 | 2,570,978,949 | 2,457,313,968 |
| | | 3,381,328,725 | 2,787,645,759 | 2,615,232,536 | 2,501,835,652 |
| 16.1 | **දීර්ඝ කාලීන ආයෝජන** | | | | |
| | **ණය සහ ලැබිය යුතු මූල්‍ය වත්කම්** | | | | |
| | ස්ථාවර තැන්පත් වල ආයෝජන | 37,477,863 | 32,521,663 | 32,253,567 | 32,521,663 |
| | **විකිණීමය ඇති මූල්‍ය වත්කම්** | | | | |
| | කොටස්වල ආයෝජන | 2,000,000 | 2,000,000 | 2,000,000 | 2,000,000 |
| | | 39,477,863 | 34,521,663 | 34,253,567 | 34,521,663 |
| | **අනුබද්ධිත ආයතන වල ආයෝජන (අප්‍රකාශිත)** | | | | |
| | මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම | - | - | 10,000,020 | 10,000,020 |
| | | - | - | 10,000,020 | 10,000,020 |
| | | 39,477,863 | 34,521,663 | 44,253,587 | 44,521,683 |
| 16.2 | **කෙටි කාලීන ආයෝජන** | | | | |
| | රෙපෝ | 23,060,945 | 354,379,710 | 23,060,945 | 354,379,710 |
| | කෙටි කාලීන ආයෝජන | 3,318,789,917 | 2,398,744,386 | 2,547,918,004 | 2,102,934,258 |
| | | 3,341,850,862 | 2,753,124,096 | 2,570,978,949 | 2,457,313,968 |
| 17 | **බඩු වට්ටෝරු** | 572,953,193 | 661,739,053 | 92,491,334 | 320,879,617 |
| 18 | **වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ** | | | | |
| | වෙළඳ ලැබිය යුතු දේ (සටහන 18.1) | 8,752,260,696 | 8,340,680,497 | 7,477,102,671 | 7,674,627,115 |
| | වෙනත් ලැබිය යුතු දේ (සටහන 18.2) | 62,188,982 | 79,214,999 | 55,085,186 | 78,865,817 |
| | තැන්පතු, පෙරගෙවීම් සහ අත්තිකාරම් (සටහන 18.3) | 123,329,312 | 162,373,973 | 1,910,821,229 | 1,827,864,387 |
| | | 8,937,778,990 | 8,582,269,469 | 9,443,009,085 | 9,581,357,319 |
| 18.1 | **වෙළඳ ලැබිය යුතු දේ** | | | | |
| | සේවාදායකයින්ගෙන් හිඟ | 4,910,809,866 | 4,851,494,259 | 4,918,751,788 | 4,813,303,421 |
| | රඳවාගත් ලැබිය යුතු දේ | 2,323,950,223 | 1,938,653,785 | 1,061,164,764 | 1,311,573,698 |
| | | 2,738,974,863 | 2,631,971,685 | 2,710,616,323 | 2,631,189,228 |
| | අඩුකලා අගය අඩුවීම සඳහා වෙන්කිරීම් (සටහන 18.1.1) | (1,221,474,256) | (1,081,439,232) | (1,213,430,205) | (1,081,439,232) |
| | | 8,752,260,696 | 8,340,680,497 | 7,477,102,671 | 7,674,627,115 |
| 18.1.1.1 | අගය අඩුවීම සඳහා වෙන්කිරීම් | | | | |
| | ආරම්භයේදී ශේෂය | 1,085,729,714 | 825,536,046 | 1,081,439,232 | 825,536,046 |
| | හඳුනාගත් අලය අඩුවීමේ අලාභය | 220,641,109 | 308,872,385 | 216,887,539 | 308,872,385 |
| | කලාහල/ප්‍රතිස්ථාපිත ප්‍රමාණය | (84,896,566) | (52,969,199) | (84,896,566) | (52,969,199) |
| | අවසානයේදී ශේෂය | 1,221,474,257 | 1,081,439,232 | 1,213,430,205 | 1,081,439,232 |
| 18.2 | **වෙනත් ලැබිය යුතු දේ** | | | | |
| | කාර්ය මණ්ඩල ණය | 38,553,373 | 45,044,790 | 38,073,373 | 45,044,790 |
| | පෙරගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය | 2,757,468 | 4,175,840 | 2,757,468 | 4,175,840 |
| | පොදු අවිනිශ්චිතතා | (41,901) | (30,530) | (23,151) | (30,530) |
| | විවිධ ණයගැතියන් | 20,123,687 | 15,751,205 | 13,481,141 | 15,402,022 |
| | WHT ලැබිය යුතු දේ | 796,355 | 14,273,695 | 796,355 | 14,273,695 |
| | | 62,188,982 | 79,214,999 | 55,085,186 | 78,865,817 |
| 18.3 | **තැන්පතු, පෙරගෙවීම් සහ අත්තිකාරම්** | | | | |
| | තැන්පතු | 12,725,152 | 8,655,238 | 9,180,234 | 7,264,484 |
| | අත්තිකාරම් | 95,901,885 | 141,059,312 | 1,892,868,464 | 1,811,978,144 |
| | පෙරගෙවීම් | 14,702,275 | 12,659,423 | 8,772,530 | 8,621,759 |
| | | 123,329,312 | 162,373,973 | 1,910,821,229 | 1,827,864,387 |
| 19 | **සම්බන්ධිත පාර්ශව සමාගම්වලින් හිඟ** | | | | |
| | මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්.) සමාගම | - | - | 1,147,466,029 | 1,278,026,970 |
| | | - | - | 1,147,466,029 | 1,278,026,970 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට)

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය 2015 රු. | සමූහය 2014 රු. | මඉඋකා 2015 රු. | මඉඋකා 2014 රු. |
|---|---|---|---|---|
| **20 මුදල් සහ මුදල් හා සමාන දේ හිතකර ශේෂයන්** | | | | |
| අතේ සහ බැංකුවේ ඇති මුදල් | **753,815,916** | 587,965,939 | **594,670,819** | 445,494,154 |
| බැංකු අග්‍රිම | **269,607** | 269,607 | **269,607** | 269,607 |
| සංක්‍රමනයෙහි ඇති මුදල් | **47,307,448** | 32,712,246 | **27,487,409** | 3,599,596 |
| | **801,392,971** | **620,947,792** | **622,427,835** | **449,363,357** |
| **අහිතකර ශේෂයන්** | | | | |
| බැංකු අයිරා | - | - | - | - |
| මුදල් ප්‍රවාහ අවශ්‍යතාවය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ | **801,392,971** | **620,947,792** | **622,427,835** | **449,363,357** |
| **21 කල්බදු ණයකරුවන්** | | | | |
| එක් වර්ෂයක් තුල ගෙවිය යුතු ගණන | **883,827** | 7,937,483 | **-** | 585,840 |
| එක් වර්ෂයකට පසුව ගෙවිය යුතු ගණන | **-** | 888,699 | **-** | |
| | **883,827** | **8,826,182** | **-** | **585,840** |
| **22 සේවක ප්‍රතිලාභ** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | **182,165,317** | 204,004,897 | **182,165,317** | 204,004,897 |
| වර්ෂය සඳහා වෙන්කිරීම | **19,492,872** | 15,117,495 | **18,473,950** | 15,117,495 |
| | **201,658,189** | 219,122,392 | **200,639,267** | 219,122,392 |
| වර්ෂය තුල කරන ලද ගෙවීම් | **(24,200,356)** | (36,957,075) | **(24,200,356)** | (36,957,075) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **177,457,833** | **182,165,317** | **176,438,911** | **182,165,317** |

a) 2015 දෙසැම්බර් 31 වැනි දිනට මඉඋකා සහ සමූහයේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්, වෘත්තීය සුදුසුකම් සහිත ආයුගණක ආයතනයක් වන සීමාසහිත ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පෞද්.) සමාගම මඟින් සිදු කරන ආයුගණක තක්සේරු මත පදනම් වේ. ඒ අනුව, 2015 දෙසැම්බර් 31 වැනි දිනට මඉඋකා සහ සමූහයෙහි අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීමෙහි අරමුදල් නොලැබූ වර්තමාන වටිනාකම රු.මිලියන 176කි.

b) ගණනය කිරීමේදී යොදාගත් ප්‍රධාන උපකල්පන පහත දක්වා ඇත

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාතය | **10%** | 10% |
| සේවක පිරිවැටුම් සාධකය | **0.01% - 0.18%** | 0.01% - 0.15% |
| විශ්‍රාම ගැන්වීමේ වයස | **60 Years** | 60 Years |

c) අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලසුම සඳහා වියදම්

| | | |
|---|---|---|
| පොළී පිරිවැය | **18,216,532** | 20,400,490 |
| වර්තමාන සේවා පිරිවැය | **14,184,516** | 14,766,050 |
| වහාම හඳුනාගත් ශුද්ධ ආයුගණක ලාභ/(අලාභ) | **(13,927,098)** | (20,049,045) |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වහාම හඳුනාගත් වියදම් | **18,473,950** | 15,117,495 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමූහය 2015 රු. | සමූහය 2014 රු. | මෞලිකා 2015 රු. | මෞලිකා 2014 රු. |
|---|---|---|---|---|
| **23 විලම්භිත බදු** | | | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | **6,477,006** | 228,141 | | |
| වර්ෂය තුළ වෙන්කිරීම් | **11,140,808** | 6,248,865 | | |
| වර්ෂය අවසානයේදී ශේෂය | **17,617,813** | 6,477,006 | | |
| **24 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ** | | | | |
| වෙළඳ ගෙවිය යුතු දේ (සටහන 24 1) | **10,278,486,607** | 9,737,696,372 | **10,540,694,377** | 11,151,130,052 |
| වෙනත් ගෙවිය යුතු දේ (සටහන 24 2) | **598,968,216** | 748,007,929 | **391,061,682** | 573,704,353 |
| | **10,877,454,823** | **10,485,704,301** | **10,931,756,058** | **11,724,834,405** |
| **24.1 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ** | | | | |
| ණයගැතියන් | **3,694,215,992** | 2,752,035,300 | **3,476,350,036** | 4,671,202,415 |
| ගණුදෙනුකරුවන්ට හිඟ | **2,721,236,946** | 3,092,010,112 | **2,582,909,025** | 2,015,533,738 |
| සේවයේ යෙදවීමේ සහ වෙනත් අත්තිකාරම් | **3,494,653,710** | 3,514,139,617 | **3,296,111,961** | 3,479,785,137 |
| කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රඳවාගැනීම් | **368,379,960** | 379,511,343 | **1,185,323,355** | 984,608,762 |
| | **10,278,486,607** | **9,737,696,372** | **10,540,694,377** | **11,151,130,052** |
| **24.2 වෙනත් ගෙවිය යුතු දේ** | | | | |
| නොගෙවූ වැටුප් | **673,958** | (566,477) | **266,255** | (566,477) |
| විවිධ ණයගැතියන් | **64,065,064** | 54,070,619 | **53,838,660** | 49,609,241 |
| ගෙවිය යුතු තැන්පත් | **382,670** | 384,244 | **382,670** | 384,244 |
| උපචිත වියදම් | **336,573,012** | 406,106,210 | **257,565,814** | 330,046,519 |
| VAT සහා වෙන්කිරීම | **-** | | **-** | |
| PAYE බදු | **5,864,442** | 4,888,684 | **5,675,798** | 4,798,783 |
| අවලංගු කළ චෙක්පත් | - | 4,927,410 | - | 2,754,693 |
| වෙනත් බදු | **191,409,071** | 278,197,239 | **73,332,485** | 186,677,350 |
| | **598,968,216** | **748,007,929** | **391,061,682** | **573,704,353** |
| **25 ගෙවිය යුතු ආදායම් බදු** | | | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | **737,897,410** | 546,972,887 | **717,039,064** | 531,111,429 |
| වර්ෂය සඳහා ආදායම් බදු | **276,217,628** | 265,700,526 | **250,935,705** | 243,267,389 |
| පසුගිය වර්ෂයට අදාලව වෙන්කිරීම් | **-** | - | | |
| වර්ෂය තුල සිදු කරන ලද ගෙවීම් | **(233,458,346)** | (65,704,199) | **(211,600,000)** | (48,842,740) |
| රැඳවුම් බදු | **(6,214,977)** | (9,071,804) | **(5,009,058)** | (8,497,014) |
| වර්ෂය අවසානයේදී ශේෂය | **774,441,714** | **737,897,410** | **751,365,710** | **717,039,064** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට)

**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

## 27 සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු

### 27.1 අනුබද්ධිත ආයතන සමඟ ගනුදෙනු

a) ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා ප්‍රධාන ආයතනයේ (මඉඋකා) සහ සමූහයේ අනුබද්ධිත ආයතනයේ (මඉසේස) සභාපති වන අතර 2015 දෙසැම්බර් 31 වැනි දිනට මඉඋකා හි අධ්‍යක්ෂවරුන් වූ එම්.ආර්.පී.රණතුංග, එස්.එම්.එන්.එල්. සේනානායක, ඉංජි. එච්.ඩී. ජයසේකර යන මහත්වරුන් මඉසේස හි ද අධ්‍යක්ෂවරුන් විය.සමාගම සමාලෝචිත වර්ෂය තුලදී මඉඋකා සමඟ ගනුදෙනු සිදු කර ඇති අතර විස්තර පහත දක්වා ඇත;

**2015 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පහත පරිදි වෙනස් කර ඇත**

| නම | තනතුර | |
|---|---|---|
| | **මඉඋකා** | **මඉසේස** |
| ඉංජි.ජී.ඩී.ඒ.පියතිලක මහතා | සභාපති | සභාපති |
| එම්.ආර්.පී.රණතුංග මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ |
| ඉංජි.එන්.රූපසිංහ මහතා | අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ |
| එස්.එම්.එන්.එල්.සේනානායක මහතා | අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ |

තවද, මඉඋකා හි ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන්නන් මෙන්ම මඉසේස හි අධ්‍යක්ෂවරයන්ද වන පුද්ගලයන් පහත පරිදි වේග

| නම | තනතුර | |
|---|---|---|
| | **මඉඋකා** | **මඉසේස** |
| ඉංජි.කේ.එල්.එස් . සහබන්දු මහතා | සාමාන්‍යාධිකාරී | අධ්‍යක්ෂ |
| ඉංජි.ටී.ඩී.වික්‍රමරත්න මහතා | ඒකාබද්ධ අතිරේක සාමාන්‍යාධිකාරී (උපදේශන) | අධ්‍යක්ෂ |
| ඉංජි.එස්.පී.පී.නානායක්කාර මහතා | ඒකාබද්ධ අතිරේක සාමාන්‍යාධිකාරී (EPC) | අධ්‍යක්ෂ/ප්‍රවීනි |
| ඉංජි.ඒ.ගල්කැටිය මහතා | අතිරේක සාමාන්‍යාධිකාරී | අධ්‍යක්ෂ |
| යූ.එන්.ඩී.මාවතගම මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | අධ්‍යක්ෂ |

b)

| ගණුදෙනු වල ස්වභාවය | වටිනාකම | |
|---|---|---|
| | **2015 රු.** | **2014 රු.** |
| උප කොන්ත්‍රාත් පිරිවැය | 5,833,113,570 | 4,810,727,985 |
| වාහන කුලියට ගැනීමේ වියදම් | 39,406,657 | 30,216,137 |
| යන්ත්‍රසූත්‍ර කුලියට ගැනීමේ වියදම් | - | 9,947,459 |
| යන්ත්‍රසූත්‍ර කුලියට දීමේ ආදායම | - | 22,133,220 |
| වැඩපොළ ආදායම් | 1,270,314 | 1,777,419 |
| ඇස්ෆාල්ට් විකිණීම | - | 1,289,746 |
| රසායනාගාර පරීක්ෂණ ආදායම | 2,096,151 | 7,370,466 |

### 27.2 සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනුවල නියමයන් සහ කොන්දේසි

සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ආදායම් සහ දරනු ලැබූ වියදම් හෝ සම්බන්ධිත පාර්ශව වලින් මිලදීගැනීම් නිදහස් ගනුදෙනු සඳහා මේ වන විට පවතින නියමයන් වලට සමාන නියමයන් වලට වාර්තා කරනු ලැබේ. වර්ෂ අවසානයට පවතින හිඟ ශේෂයන් නොසුරැකුණු, පොලියෙන් නිදහස් සහ නිරවුල් කිරීම මුදලින් සිදු වේ. කිසිදු සම්බන්ධිත පාර්ශව ලැබීම් හෝ ගෙවීම් සඳහා වගකීම් ලබා දී හෝ ලැබී නොමැත. මෙම සටහන, මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 19 සමඟ කියවිය යුතුය.

### ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු

LKAS 26'සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම්, ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මඟපෙන්වීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම පවතින පුද්ගලයින් ප්‍රධාන කළමනාකරණ පිරිස වේ ඒ අනුව, සමාගමේ/සමූහයේ ප්‍රධාන කළමනාකරණ පිරිස වන අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්) ප්‍රධාන කළමනාකරණ පිරිස ලෙස වර්ගීකරණය කර ඇත

| ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ගෙවන ලද වන්දි | සමූහය | | මඉඋකා | |
|---|---|---|---|---|
| | **2015 රු.** | **2014 රු.** | **2015 රු.** | **2014 රු.** |
| වැටුප් සහ වෙනත් රැකියා ප්‍රතිලාභ | 2,811,789 | 2,890,468 | 1,371,968 | 1,371,968 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට)

## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

### 28 බැඳීම් සහ අවිනිශ්චිතතා

පහත සඳහන් දේ වලට අමතරව වාර්තාකරණ දිනට මඉලකා හෝ එහි සමූහයෙහි භෞතික  බැඳීම් සහ අවිනිශ්චිත බැරකුම් නොමැත

### 28.1 අවිනිශ්චිතතා

**මඉලකාට එරෙහිව පවරා ඇති නඩු**

| නඩු අංකය | විස්තරය | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| MR/8748<br>දිස්ත්‍රික් උසාවිය, මාතලේ | එච් ඩී ආර් එස් දිද්දෙණිය සහ ඒ ඒ පි ඉන්දුසිරි දඹුල්ල*කණ්ඩලම මාර්ගය අසල පිහිටි ඔවුන්ගේ නිවසට සිදු වූ අලාභහානි වෙනුවෙන් රු 8,000,00000 ඉල්ලා සිටී අලාභහානි සිදු වී ඇත්තේ මාර්ගය ඉදිකිරීමෙන් නොවන බව පරීක්ෂණ වලදී අනාවරණය වී ඇත | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 296/ හානි<br>දිස්ත්‍රික් උසාවිය, අම්පාර | මඉලකා වාහනයක් මඟින් සිදු වූ රිය අනතුරකින් මිය ගිය පුතණුවන් වෙන්වෙන් සීසමන්ත නන්ද සිල්වා රු 2,500,00000 ක් වන්දි මුදලක් ඉල්ලා සිටී | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 155/හානි<br>දිස්ත්‍රික් උසාවිය, කඩුවෙල | මඉලකා ඉදිකිරීම් වැඩපොළකින් පතිත වූ ඉදිකිරීම් ද්‍රවය හේතුවෙන් ඔවුන්ගේ විදුලි ජනක යන්ත්‍රයට හානි සිදු වූයේ යැයි පවසමින් රු1,664,67700ක් ගෙවන මෙන් ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය ඉල්ලා ඇති එවැනි ද්‍රව්‍යය මඉලකා ඉදිකිරීම් සඳහා යොදා ගෙන නොමැති බැවින් මඉලකා නඩුව විසංවාදී කරමින් පවතී | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 956/එම්<br>දිස්ත්‍රික්  උසාවිය, වැලිමඩ | අනතුරක් හේතුවෙන් සිදු වූ හානි වෙන්වෙන් සුන්දර රාජ් වරුන් කුමාර් සහ සුප්පයියා ආසිරි සුන්දර රාජ් රු 1,000,000/* ක වන්දි මුදලක් ඉල්ලා සිටී | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 524/හානි<br>දිස්ත්‍රික් උසාවිය, කඩුවෙල | අනතුරක් හේතුවෙන් සිදු වූ හානි වෙනුවෙන් එම්අයිඑස් යොමාල් පෙරේරා මඉලකා ගෙන් රු 10,000,000/* වන්දි මුදලක් ඉල්ලා සිටී | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| කොකාවිල් හි මීටර් 172ක් උස ස්වයං*සහාය යකඩ විකාශන කුළුණක් ඉදිකිරීම බේරුම්කාරවරයා විසින් කරන ලද අභියෝජනාව | කුළුණ සිටුවීමට සහ තීන්ත ආලේප කිරීම සඳහා වැඩි වූ පිරිවැය සඳහා වෙස්ට්ල් සොලූෂන්ස් ලංකා රු64,312,62300 ක් ඉල්ලා ඇති වෙස්ට්ල් සමඟ එකඟ වූ කොන්ත්‍රාත්තුව අනුව, ස්ථාවර එකවර ගෙවීම මත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති බැවින් අමතර හිමිකම්පෑම් සළකා බැලීමට විධිවිධාන නොමැති බැවින් මඉලකා නඩුව විසංවාදී කරමින් පවතී | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 370/එම්<br>දිස්ත්‍රික් උසාවිය, මල්ලාකම් | මඉලකා හි නොසැළකිල්ල නිසා සිදු වූ ඇයගේ ස්වාමි පුරුෂයාගේ මරණය වෙනුවෙන් සින්නරාසා සිවරාසා හම්සවදනි (වැන්දඹුව) සහ වෙනත් පුද්ගලයින් 06 දෙනෙකු විසින් මඉලකා න් රු 70,000,00000 වන්දි මුදලක් ඉල්ලා සිටී | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 32246/5<br>මහේස්ත්‍රාත් උසාවිය, කොළඹ | අනුයුක්ත කාල පරිච්ඡේදය සඳහා රු 212,10990ක් ඉල්ලා සිටිමින් | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 1564/13<br>දිස්ත්‍රික් උසාවිය, කොළඹ | ඉංජි ඩබ්කේජීඅයි රුද්‍රිගෝ මහතා විසින් අපහාස නඩුවක් ගොනු කර ඇති අතර රු 500,000,00000 ක් වන්දි මුදලක් ලෙස ඉල්ලා සිටී | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 1820/13 ඩීඑම් ආර්<br>දිස්ත්‍රික් උසාවිය, කොළඹ | කම්කරු පිරිවැය ලෙස තුවාන් වම්සා කසීම් මහතා මඉලකා න් රු 1,000,00000 කි ඉල්ලා සිටී | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 1286/එල්<br>මහේස්ත්‍රාත් උසාවිය, හම්බන්තොට | ජීවන වියදම් දීමනාව සඳහා සේඅඅ ලෙස රු1,374,35445ක හිමිකමක් සඳහා කම්කරු කොමසාරිස්වරයා විසින් මඉලකාට එරෙහිව මෙම නඩුව පවරා ඇති | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |
| 609/14 ඩීඑම් ආර්,<br>දිස්ත්‍රික් උසාවිය, කොළඹ | ඒඩීකේපීපිටියේකුඹුර මෙය රු30,000,00000 ක හිමිකමක් සඳහා මඉලකාට එරෙහිව නඩු පවරා ඇති නමුත් කාර්යයන් සිදු කර ඇත්තේ මඉසේස විසිනි | .කාරණය මේ වන තෙක් විසඳී නොමැත |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සීඊඑන්/බී/සීඊසීබී/එෆ්ඒ/2015    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2017 මැයි 18 දින

සභාපති,

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) මූල්‍ය ප්‍රකාශන හා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා එහි පරිපාලිතයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) මූල්‍ය ප්‍රකාශන හා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 විගණන මතය**

**(අ) තත්ත්වාගණනය කළ මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**(ආ) තත්ත්වාගණනය කළ මතය - ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

රු.41,901 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂයක් සමාලෝචිත 2015 වර්ෂය සඳහා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමෙන් හා ගිණුම්වල ගැලපීම් කිරීමෙන් තොරව දක්වා තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
AGDSL
Auditor General's Department

## 2.3 ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති 09 කට අදාළව වර්ෂය අවසානයේ ණයගැති ශේෂය තහවුරු කර ගැනීමේදී ගෙවීම් සහතික/ සහතික කරන ලද බිල්පත්‍රවල මුදල් ප්‍රමාණයන් කාර්යාලය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ව්‍යාපෘතිවල ණයගැති ශේෂයන් පිළිබඳ සත්‍ය තත්ත්වය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.15,944,859 කින් හා රු.17,021,023 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් නිම කරන ලද ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති 48 කට අදාළව එකතුව රු.285,307,117 ක් වූ අයකර නොගත් වැඩ පූර්ව අත්තිකාරම් ගිණුම්වල පැවතුණි. ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය විසින් නිකුත් කරන ලද අංක අයිසීටීඒඩී/එස්බිඩී/02 දරන සම්මත ලංසු ලියකියවිලිවල 14.2 (ආ) වගන්තිය කොන්ත්‍රාත් කොන්දේසි 03 වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතිය සියයට 90 ක ප්‍රගතියට ළඟා වීමට පෙර වැඩපූර්ව අත්තිකාරම් සම්පූර්ණයෙන් අයකර ගන්නා හෙයින් මෙම ශේෂය එහි ස්වභාවයෙන් අසාමාන්‍ය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් ආදායම නිශ්චය කරගැනීමේදී අංක D 1726, D 1691, D 1721, D 1758, D 884 හා D 1597 දරන සම්පූර්ණයෙන් නිමකරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 6 කට අදාළව රු.1,807,996,165 ක ගලපන ලද කොන්ත්‍රාත් මුදල ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඉදිකිරීම් ආදායම රු. 83,009,985 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) අංක 871 දරන ව්‍යාපෘතියේ හා අංක C 880 දරන උපදේශක ව්‍යාපෘතියේ පිළිවෙලින් ඉන්වොයිස් අංක 31 හා අංක 27 ට අනුව, රු.2,162,929 ක් හා රු.5,356,240 ක වැඩපූර්ව අත්තිකාරම් ශේෂය සම්පූර්ණයෙන් අයකර ගෙන තිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල මෙම මුදල් ලැබිය යුතු මුදල් ලෙස දක්වා තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු වැඩපූර්ව අත්තිකාරම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද, අංක 29 දරන ඉන්වොයිසියට අදාළ රු.3,641,916 ක වැඩ පූර්ව අත්තිකාරම සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දෙවරක් ගිණුම්ගත කර

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂය රු.3,641,916 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවේ වාර්තා කරන ලද පරිදි, 2012 වර්ෂයේ මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 3,601 ක් වටිනා වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් කාර්යාංශයට ලැබී තිබුණි. කෙසේ වුවද එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී කාර්යාංශයට ගෙවිය යුතු කොන්ත්‍රාත් ගෙවීම්වලින් රු.මිලියන 250 ක මුදලක් අයකර ගෙන තිබුණි. තවද එම වත්කම් පිළිබඳ කිසිදු වෘත්තීමය තක්සේරුවක් සිදුකිරීමෙන් තොරව සහ රු.මිලියන 3,351 ක ප්‍රදානය නොසලකා රු.මිලියන 250 ක වටිනාකමට කාර්යාංශය විසින් එය ගිණුම්ගත කර තිබුණි.

(ඊ) අංක C 880 හා C 1189 දරන උපදේශක ව්‍යාපෘති සම්බන්ධයෙන් පිළිවෙලින් රු.5,367,016 ක් වටිනා ඉන්වොයිසි 3 ක් හා රු.1,221,047 ක් වූ උපදේශක ආදායම 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(උ) උපදේශක ව්‍යාපෘතිවල ණයගැති ශේෂය තහවුරු කරගැනීමේදී රු.128,049,658 ක් වටිනා සහතික කළ බිල්පත්‍ර වෙනුවට රු.144,463,477 ක් වූ ඉන්වොයිස් වටිනාකම සැලකිල්ලට ගෙන තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂය රු.16,413,819 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2015 වර්ෂය අවසානයට මූලස්ථාන කාර්යාලයක මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දැක්වෙන මෝටර් වාහන 7 ක් වෙනත් මූලස්ථාන කාර්යාලයක මූල්‍ය ප්‍රකාශනවල නැවත දක්වා තිබුණි. එබැවින් 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් ශේෂය පිළිබඳ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

### 2.3.2 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජාවත්ත මූලස්ථාන කාර්යාලයේ තොග ශේෂය හා එම කාර්යාලයේ භෞතික තොග සත්‍යාපන ශේෂය අතර රු.2,002,841 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

### 2.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලස්ථාන කාර්යාල 11 ක ව්‍යාපෘති 202 කට අදාළව රු.528,611,508 ක ඉදිකිරීම් අංශ ණයගැති ශේෂය අයකර ගැනීමෙන් තොරව වර්ෂ 4 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. 2016 ඔක්තෝබර් 30 වන විටත් කිසිදු අයකිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව එම ණය ශේෂය හිඟ හිට පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) උපදේශක අංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 51 කට අදාළ රු.34,287,514 ක් වූ හිඟ හිටි ණය ශේෂය වර්ෂ 4 කට වැඩි කාලයක් පැවතුණු අතර එම ණය ශේෂය 2016 මැයි 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) සම්පූර්ණයෙන් නිමකරන ලද ජල සම්පත් ඒකකයේ උපදේශක ව්‍යාපෘති 4 කට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වූ එකතුව රු.1,188,982 ක් වූ නොපියවූ වැඩපූර්ව අත්තිකාරම් වර්ෂ 5 කට වැඩිකාලයක් පැවතුණි.

### 2.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.4,621,437,551 ක් වූ ලැබිය යුතු රඳවාගැනීම් මුදල්, තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් පිළිබඳ කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් මෙම ශේෂයන් පිළිබඳ විශ්වාසදායී බව විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ආ) උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.1,185,323,365 ක් වූ රඳවා ගැනීම් මුදල් 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එසේ වුවද, උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් දක්වමින් මෙම කාර්යය සඳහා ලේඛනයක් මූලස්ථාන කාර්යාල විසින් පවත්වා නොතිබුණි. තවද, ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් පිළිබඳ උපලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් පිළිබඳ නිරවද්‍යතාවය හා විශ්වාසදායී බව විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව රුඳවීම් දීමනා, පුද්ගලික දීමනා සහ වෘත්තීය දීමනා ආදී විවිධ දීමනා කාර්යාංශයේ ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින්ට ගෙවා තිබුණි. 2015 වර්ෂය සඳහා එසේ ගෙවන ලද මුළු දීමනා මුදල රු.139,720,462 ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.595,972,241 ක හා රු.713,584,787 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු.552,433,247 ක් හා රු.684,222,033 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු.43,538,994 ක් හා රු.29,361,755 ක් හෙවත් සියයට 07.9 ක හා සියයට 4.3 ක වර්ධනයක් දැක්වුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය ආදායම පිළිවෙලින් රු.4,772,839 කින් හා රු.14,315,016 කින් වැඩිවීම සහ මෙහෙයුම වියදම පිළිවෙලින් රු.260,617,259 කින් හා රු.152,299,283 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වර්ධනයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ හා සමූහයේ ආදායම පිළිවෙලින් රු.2,549,226,637 කින් හා රු.1,977,945,700 කින් අඩුවී තිබුණි.

කාර්යාංශයේ අගය එකතු කිරීම සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 2,171 ක් වූ අතර, ඉකුත් වර්ෂ 04 ක අගය එකතු කිරීම විශ්ලේෂණය කිරීමේදී 2013 වර්ෂයේ හැර ක්‍රමයෙන් වර්ධනයක් දැක්වුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවකයන් 1,350 කින් සමන්විත එහි කාර්ය මණ්ඩලය හා රු.මිලියන 16,607 ක මුළු වත්කම් පදනම උපයෝජනය කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාංශය විසින් රු.මිලියන 596 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් උපයාගෙන තිබුණි. එබැවින් ලාභය, කාර්යාංශයේ මුළු වත්කම්වලින් සියයට 3.58 කින් නියෝජනය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පිළිවෙලින් සියයට 4.9 ක් හා සියයට 3.7 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම ලාභ ආන්තික පිළිවෙලින් සියයට 0.7 කින් හා සියයට 0.63 කින් සුළු වශයෙන් වැඩි වී තිබුණි.

## 4. කාර්යසාධන සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, උපදේශක අංශය හා ඉදිකිරීම් අංශය සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ එහි ඉලක්කයන් 2 ක් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සියලු වර්ගයේ ඉංජිනේරු උපදේශක සේවාවන්හිදී ජාතියට සේවය කිරීම සඳහා අත්‍යවශ්‍ය සියලු භෞතික හා මානව සම්පත් සහිතව කාර්යාංශයේ උපදේශක අංශය සම්පූර්ණයෙන් සම්පාදනය වී ඇත. කෙසේවුවද, කාර්යාංශය ස්ථාපනය කිරීමේ අරමුණුවලට පටහැනිව, වර්තමානයේදී උපදේශක සේවාවන්ට වඩා ඉදිකිරීම් වැඩ කෙරෙහි ප්‍රධාන වශයෙන් යොමු තිබුණි.

AGDSL

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

**4.2 කළමනාකරණ දුර්වලතා**

2006 සිට 2011 දක්වා කාලපරිච්ඡේදය සඳහා සේවක අර්ථසාධක අරමුදලට (EPF) හා සේවක භාරකාර අරමුදලට (ETF) දායකය ජීවනාධාර දීමනා සැලකිල්ලට ගැනීමෙන් තොරව ගණනය කර තිබුණි. එබැවින්, සේවක දායකයේ කොටසක් ලෙස සියයට 50 ක අධිභාරයක්ද ඇතුළත්ව කාර්යාංශය විසින් රු.79,520,536 ක මුදලක් අතිරේකව ගෙවා තිබුණි.

**4.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශය විසින් ජාතිය ගොඩනැගීමේ බදු (NBT) හා එකතු කළ අගය මත බදු (VAT) මුදල් පදනම මත ගෙවනු ලැබේ. කෙසේ වුවද 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත හා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අනුව ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කළ අගය මත බදු මුදල් පදනම මත ගෙවීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය කාර්යාංශයට මෙතෙක් ලැබී නොතිබුණි.

(ආ) කාර්යාංශයේ මූලස්ථාන කාර්යාලවල උපයෝජනය සඳහා වාහන මිලදී ගැනීමේ අරමුණින් කාර්යාංශය විසින් සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා සමාගමට (CESL) මුදල් අත්තිකාරම් ගෙවා තිබුණි. පසුව සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම විසින් එම අත්තිකාරම් උපයෝජනය කර වාහන මිලදී ගෙන කාර්යාංශයට කුලියට දී තිබුණි. කුලී ගාස්තුවලට සියයට 10 ක කළමනාකරණ ගාස්තුවක් සහිතව වර්ෂ 5ක් ඇතුළත කාර්යාංශයෙන් ලැබිය යුතු කුලී ආදායමෙන් ඉහත මුදල් අත්තිකාරම් සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම විසින් නිරවුල් කළ යුතුය. තවද, වර්ෂ 5 ක් අවසානයේ මෙම වාහනවල අයිතිය සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම යටතේ පැවතුණි.

**4.4 අවිධිමත් ගනුදෙනු**

ගෙවීම් කරන අවස්ථාවේදී එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි අංක හා එකතු කළ අගය මත බදු ඉන්වොයිසිවල වලංගු භාවය පරීක්ෂා කිරීමෙන් තොරව එකතුව රු.3,956,356 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) කාර්යාංශය විසින් කොන්ත්‍රාත්කරුවන් 22 දෙනෙකුට ගෙවා තිබුණි. පසුව, කොන්ත්‍රාත්කරුවන් විසින් සඳහන් කර ඇති එකතු කළ අගය මත බදු අංක හා නම් වලංගු ඒවා නොවන බව පෙනී ගොස් තිබුණි.

AGDSL විගණකාධිපති දෙපාර්තමේන්තුව Auditor General's Department

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් කාර්යාංශය භාර ගන්නා ලද ඉදි කිරීම් කොන්ත්‍රාත් 31 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ කාර්යාංශය විසින් රු.158,737,294 ක පාඩුවක් දරා තිබුණි.

(ආ) සම්මත තාක්ෂණික කමිටුව විසින් අනුමත කරන ලද අංක 1353 දරන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු.27,112,744 ක් විය. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද තථ්‍ය පිරිවැය රු.37,523,409 ක් විය. එබැවින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් කාර්යාංශය දරන ලද පාඩුව රු.10,410,665 ක් විය.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

කාර්යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 1,350 ක් හා 1,471 ක් විය. සියලු සේවක වර්ගවල අනුමත සේවක සංඛ්‍යාව 121 කින් ඉක්මවා බඳවා ගැනීම් කර තිබූ හෙයින් විධිමත් සේවක කළමනාකරණයක් නිරීක්ෂණය නොවීය.

**4.7 අරමුදල් ඌන උපයෝජනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල සම්පත් ඒකකය යටතේ බ්‍රෝඩ් ලැන්ඩ් ව්‍යාපෘතිය සඳහා විවෘත කරන ලද බැංකු ජංගම ගිණුමක රු.80,325,947 ක මුදලක් මාස 02 කට වැඩි කාලයක් කිසිදු කාර්යයකට යොදා ගැනීමෙන් තොරව පැවතුණි.

(ආ) වරාය පුනරුත්ථාපනය සඳහා මාලදිවයින් සුනාමි ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා උපදේශක සේවය 2014 ජූලි මාසයේදී සම්පූර්ණයෙන් නිමකර තිබුණද, රු.8,047,501 ක (MVR 856,016.91) ජංගම ගිණුම් ශේෂයක් කාර්යාංශයට ආපසු යැවීමකින් තොරව බැංකුවක පැවතුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කාර්යාංශයේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හෝ පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම් | අදාළ පාර්ශවයන් විසින් සනාථ කිරීමෙන් තොරව ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ වර්ෂ 04 කට වැඩි කාලයක් පැවතුණි. |
| (ආ) | ඉන්වෙන්ට්‍රි පාලනය හා තොග කළමනාකරණය | ශේෂපත්‍ර දිනයට වැඩ බිමේ තිබූ ඉන්වෙන්ට්‍රි හා තොග මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |
| (ඇ) | ඉන්වොයිස් කිරීම | ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළව තථ්‍ය වැඩ නිමකිරීම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |

එච්.එම්.ගාමිණි විජේසිංහ
විගණකාධිපති

අ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# ඉංජිනේරුමය කාර්යයන් පිලිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

**දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වසර සඳහා**

| | 2015 | | 2014 | | 2013 | | 2012 | | 2011 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සමූහය රු. | මඉඋකා රු. | සමූහය රු. | මඉඋකා රු. | සමූහය රු. | මඉඋකා රු. | සමූහය රු. | මඉඋකා රු. | සමූහය රු. | මඉඋකා රු. |
| ආදායම | 11,423,636,967 | 10,710,472,734 | 13,401,582,667 | 13,259,699,366 | 15,132,718,158 | 15,131,164,037 | 13,051,404,569 | 13,051,404,569 | 8,550,176,848 | 8,550,176,848 |
| විකුණුම් පිරිවැය | (9,679,902,097) | (9,448,860,733) | (11,487,873,150) | (11,656,600,792) | (13,280,839,809) | (13,414,329,871) | (11,427,073,880) | (11,491,305,532) | (7,592,905,377) | (7,626,512,721) |
| **දළ ලාභය** | **1,743,734,870** | **1,261,612,002** | **1,913,709,517** | **1,603,098,574** | **1,851,878,349** | **1,716,834,166** | **1,624,330,689** | **1,560,099,037** | **957,271,471** | **923,664,127** |
| වෙනත් ආදායම් | 168,515,920 | 173,393,789 | 147,476,316 | 169,674,146 | 153,445,158 | 144,727,925 | 394,515,789 | 378,235,199 | 291,500,170 | 289,825,801 |
| පරිපාලන වියදම් | (1,128,975,590) | (759,749,098) | (1,189,348,793) | (1,033,810,083) | (1,255,752,763) | (1,151,711,425) | (1,183,162,649) | (1,118,904,881) | (951,787,024) | (921,391,793) |
| විකුණුම් සහ බෙදාහැරීම් පිරිවැය | (222,249,855) | (220,503,209) | (314,175,035) | (314,175,035) | (335,210,717) | (321,479,322) | (316,855,524) | (316,855,524) | (84,396,410) | (84,396,410) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබීම්** | **561,025,344** | **454,753,483** | **557,662,005** | **424,787,602** | **414,360,027** | **388,371,344** | **518,828,305** | **502,573,831** | **212,588,207** | **207,701,724** |
| මූල්‍ය ආදායම | 168,766,491 | 150,007,977 | 154,451,475 | 145,235,138 | 217,808,170 | 213,907,634 | 201,368,165 | 199,625,758 | 114,975,754 | 114,939,272 |
| මූල්‍ය ගාස්තු | (16,207,048) | (8,789,218) | (27,890,447) | (17,589,492) | (22,154,752) | (17,532,829) | (24,343,420) | (20,123,026) | (15,444,710) | (14,609,857) |
| **ශුද්ධ මූල්‍යආදායම** | 152,559,443 | 141,218,758 | 126,561,028 | 127,645,646 | 195,653,418 | 196,374,805 | 177,024,745 | 179,502,732 | 99,531,044 | 100,329,415 |
| **ආදායම් බදු පෙර ලාභය** | **713,584,787** | **595,972,241** | **684,223,033** | **552,433,247** | **610,013,445** | **584,746,149** | **695,853,050** | **682,076,563** | **312,119,251** | **308,031,139** |
| ආදායම් බදු | (287,358,436) | (250,935,705) | (271,949,391) | (243,267,389) | (267,791,716) | (256,524,029) | (291,677,345) | (285,794,064) | (164,074,708) | (161,905,298) |
| **ශුද්ධ ලාභය** | **426,226,351** | **345,036,536** | **412,273,642** | **309,165,858** | **342,221,729** | **328,222,120** | **404,175,705** | **396,282,499** | **148,044,543** | **146,125,841** |

වරහන් තුළ ඇති අගයන්ගෙන් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.

# ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**දෙසැම්බර් මස 31 වැනි දිනට**

| | 2015 | | 2014 | | 2013 | | 2012 | | 2011 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සමූහය | මෞලිකා | සමූහය | මෞලිකා | සමූහය | මෞලිකා | සමූහය | මෞලිකා | සමූහය | මෞලිකා |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | | | | |
| දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 3,088,678,195 | 2,686,829,682 | 3,298,246,727 | 2,896,020,996 | 3,362,855,558 | 3,134,280,527 | 3,217,787,244 | 3,029,322,086 | 2,664,214,277 | 2,643,168,837 |
| ආයෝජන | 39,477,863 | 44,253,587 | 34,521,663 | 44,521,683 | 38,326,397 | 38,326,417 | 68,114,301 | 68,114,321 | 64,456,627 | 64,456,647 |
| **ජංගම නොවන වත්කම්** | **3,128,156,058** | **2,731,083,269** | **3,332,768,390** | **2,940,542,679** | **3,401,181,955** | **3,172,606,944** | **3,285,901,545** | **3,097,436,407** | **2,728,670,904** | **2,707,625,484** |
| **ජංගම වත්කම්** | | | | | | | | | | |
| ඉන්වෙන්ටරි | 594,682,065 | 92,491,334 | 661,739,053 | 320,879,617 | 746,822,316 | 414,331,509 | 667,283,290 | 473,612,890 | 278,209,888 | 277,233,388 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ | 8,937,778,990 | 9,443,009,085 | 8,582,269,469 | 9,581,357,319 | 13,034,273,723 | 9,465,446,814 | 10,760,043,614 | 8,586,558,801 | 9,277,200,225 | 6,908,203,554 |
| කෙටි කාලීන ආයෝජන | 3,341,850,862 | 2,570,978,949 | 2,753,124,096 | 2,457,313,968 | 1,769,259,420 | 1,728,581,897 | 1,572,852,406 | 1,572,852,406 | 1,707,593,967 | 1,707,593,967 |
| මුදල් සහ මුදල් හා සමාන දේ | 801,392,970 | 622,427,835 | 620,947,793 | 449,363,357 | 399,435,851 | 310,353,679 | 534,761,471 | 464,311,326 | 615,208,770 | 528,777,653 |
| අන්තර් සමාගම් ජංගම ගිණුම් | - | 1,147,466,029 | - | 1,278,026,970 | - | 1,083,035,301 | - | 234,753,626 | - | |
| **මුළු ජංගම වත්කම්** | **13,675,704,887** | **13,876,373,232** | **12,618,080,411** | **14,086,941,231** | **15,949,791,310** | **13,001,749,200** | **13,534,940,781** | **11,332,089,049** | **11,878,212,850** | **9,421,808,562** |
| **මුළු වත්කම්** | **16,803,860,945** | **16,607,456,501** | **15,950,848,801** | **17,027,483,910** | **19,350,973,265** | **16,174,356,144** | **16,820,842,326** | **14,429,525,456** | **14,606,883,754** | **12,129,434,046** |
| **සමකොටස් සහ බැරකම්** | | | | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 | 500,000 |
| ප්‍රාග්ධන සංචිත | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 3,028,000 | 12,697,551 | 12,697,551 |
| රඳවාගත් ඉපැයීම් | 4,952,476,935 | 4,744,367,819 | 4,526,250,584 | 4,399,331,283 | 4,113,976,942 | 4,090,165,425 | 3,776,496,520 | 3,766,684,612 | 3,247,819,226 | 3,245,900,524 |
| **මුළු සමකොටස්** | **4,956,004,935** | **4,747,895,819** | **4,529,778,584** | **4,402,859,283** | **4,117,504,942** | **4,093,693,425** | **3,780,024,520** | **3,770,212,612** | **3,261,016,777** | **3,259,098,075** |
| **ජංගම නොවන බැරකම්** | | | | | | | | | | |
| කල් බදු ණය හිමියන් | - | - | 888,699 | - | 7,199,960 | 604,418 | 35,565,671 | 11,624,193 | 49,724,339 | 36,288,826 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 177,457,833 | 176,438,911 | 182,165,317 | 182,165,317 | 204,004,898 | 204,004,898 | 228,787,990 | 228,787,990 | 203,004,443 | 203,004,443 |
| විලම්භිත බදු | 17,617,814 | - | 6,477,006 | - | 228,141 | - | 76,387 | - | 61,355 | - |
| **මුළු ජංගම නොවන බැරකම්** | **195,075,647** | **176,438,911** | **189,531,022** | **182,165,317** | **211,432,999** | **204,609,316** | **264,430,048** | **240,412,183** | **252,790,137** | **239,293,269** |
| **ජංගම බැරකම්** | | | | | | | | | | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ | 10,877,454,823 | 10,931,756,058 | 10,485,704,301 | 11,724,834,406 | 14,451,694,061 | 11,333,291,954 | 12,328,575,900 | 10,019,342,795 | 10,584,051,848 | 8,123,827,340 |
| ගෙවිය යුතු ආදායම් බදු | 774,441,715 | 751,365,710 | 737,897,410 | 717,039,064 | 546,972,887 | 531,111,429 | 382,092,902 | 374,116,600 | 452,561,417 | 450,453,362 |
| කල් බදු ණය හිමියන් | 883,827 | - | 7,937,483 | 585,840 | 23,368,376 | 11,650,020 | 36,544,774 | 18,740,207 | 7,107,672 | - |
| අන්තර් කාර්යාල ජංගම ගිණුම් | - | - | - | - | - | - | 6,701,059 | 6,701,059 | - | - |
| අන්තර් සමාගම් ජංගම ගිණුම් | - | - | - | - | - | - | 22,473,123 | - | - | 7,406,097 |
| බැංකු අයිරා | - | - | - | - | - | - | - | - | 49,355,903 | 49,355,903 |
| **මුළු ජංගම බැරකම්** | **11,652,780,363** | **11,683,121,770** | **11,231,539,196** | **12,442,459,310** | **15,022,035,324** | **11,876,053,403** | **12,776,387,758** | **10,418,900,661** | **11,093,076,840** | **8,631,042,702** |
| **මුළු බැරකම්** | **11,847,856,010** | **11,859,560,681** | **11,421,070,218** | **12,624,624,627** | **15,233,468,323** | **12,080,662,719** | **13,040,817,806** | **10,659,312,844** | **11,345,866,977** | **8,870,335,971** |
| **මුළු සමකොටස් සහ බැරකම්** | **16,803,860,945** | **16,607,456,501** | **15,950,848,801** | **17,027,483,910** | **19,350,973,265** | **16,174,356,144** | **16,820,842,326** | **14,429,525,456** | **14,606,883,754** | **12,129,434,046** |


වරහන් තුළ ඇත් අගයන්ගෙන් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.


# ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙහි පසුබිම

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (මඉඋකා) ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා බහු-විෂය ඉංජිනේරු උපදේශන සේවා සැපයීම සඳහා 1973 අප්‍රේල් මස 12 වැනි දින පිහිටුවන ලදී. එය 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

ශ්‍රී ලංකාවේ විශාලතම සංවර්ධන ව්‍යාපෘති සමහරක ප්‍රමුඛස්ථානය ගත් කාර්යාංශය ශ්‍රී ලංකාවේ විවිධ ඉංජිනේරුමය විෂයයන්වල පුළුල් පරාසයක ප්‍රවීණතාවක් සහිත ප්‍රධාන උපදේශන ආයතනය වේ. මහවැලි ව්‍යාපෘතිය (ශ්‍රී ලංකාවේ විශාලතම ගංගාවේ ජල ගැලීම සංවර්ධනය කිරීම) ක්‍රියාවට නැංවීමේ එක් ප්‍රධාන ආයතනයක් ලෙස මඉඋකා ක්‍රියා කරන ලදී. රුපියල් බිලියන ගණනක මෙම ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී කාර්යාංශය අන්තර්ජාතික උපදේශකයින් කිහිප දෙනෙකු සමඟ සහයෝගීව කටයුතු කරන ලද අතර මෙම සහයෝගිතා තුලින් ශක්තිමත් ඉංජිනේරුමය නිපුණත්වයන් සහ ප්‍රවීණතාවන් වැඩිදියුණු කරගෙන ඇත. ප්‍රධාන ජල විදුලි සහ වාරිමාර්ග ව්‍යාපෘති ආශ්‍රිත ව්‍යාපෘති හා සම්බන්ධ සියළු යටිතලව්‍යුහ (ප්‍රවේශ මාර්ග, පාලම්, ගොඩනැගිලි සහ ජල සැපයුම්) සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කාර්යාංශය වගකිවයුතු විය. සමාජ ආර්ථික අංශ (නැවත පදිංචි කිරීම, ප්‍රජා සංවර්ධන) සහ පාරිසරික අධ්‍යයන මෙම ප්‍රධාන ව්‍යාපෘති වල ඒකාබද්ධ කොටසක් විය.

## ඉ.කා.පි.ම.උ.කා හි ප්‍රධාන අංශ



ඉ.කා.පි.ම.උ.කා ප්‍රධාන කාර්යාලය
415, බෞද්ධාලෝක මාවත,කොළඹ 07

# සාරාංශය

ඉංජිනේරු උපදේශන සේවා සැපයීම සඳහා 1973 අප්‍රේල් මස 12 වැනි දින පිහිටුවන ලදී. ප්‍රධාන යටිතලව්‍යුහ සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය දක්වා ඇත. වික්ටෝරියා, කොත්මලේ, රන්දෙණිගල, රන්ටැඹේ, මාදුරුඔය, කැනියොන්, බෝවතැන්න, සමනළ වැව, කුකුළේ ගඟ සහ කොත්මලේ වේලි වැනි ව්‍යාපෘති සඳහා දායකත්වය දක්වා ඇත.

එහි ආරම්භයේ සිට ස්වයං මූල්‍ය වන අතර සාර්ථකව ක්‍රියාකාරී වී ඇත. රජයේ ආදායම් සඳහා දායකත්වය ලබා දී ඇත.

450කට වඩ් වැඩි ඉංජිනේරුවරුන්, 50කට වඩා වැඩි ගෘහ නිර්මාණ ශිල්පීන් සහ 500 කට වඩා වැඩි තාක්ෂණික නිලධාරීන්ගෙන් සමන්විත වන පුහුණු, පළපුරුදු සහ ඉහළ අභිප්‍රේරණයක් සහිත ශ්‍රම බලකායක් සතු වේ.

1995දී ඉදිකිරීම් අංශයට (EPC) ව්‍යාප්ත වන ලදී. ගොඩනැගිලි, මහාමාර්ග, නිදහස් වෙළඳ කලාප, ආර්ථික මධ්‍යස්ථාන, රෝහල්, කර්මාන්ත උද්‍යාන ආදිය ඉදිකිරීමෙහි නිරතවන ලදී.

දිගන,අනුරාධපුර, ගාල්ල, රත්නපුර, බදුල්ල, කන්තලේ, අම්පාර, ජාවත්ත, බත්තරමුල්ල, ගම්පහ, මහරගම සහ යාපනය යන ප්‍රාදේශීය කාර්යාල 12 තුළින් දිවයින පුරා මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබේ.

යුද ගැටුම්වලින් පසු සංවර්ධන කාර්යයන් සඳහා රජයේ සහායකයා විය

- උතුරු වසන්ත
- උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය
- නැගෙනහිර නවෝදය
- ගැටුම්වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි හදිසි ව්‍යාපෘතිය (CARE)

මාලදිවයින, ඉන්දියාව, මියන්මාරය,එක්සත් රාජධානිය, ටැන්සානියාට, රුවන්ඩාව, නැගෙනහිර අප්‍රිකානු කලාපය වැනි අන්තර්ජාතික වෙළඳපොළ සඳහා 2007 වර්ෂයේ සිට යොමු විය.

හිතකර මූල්‍ය කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලද රජය සතු සාර්ථක ව්‍යවසායන් (SOE) 20 අතරට ලැයිස්තුගත වී ඇත.

2005 වර්ෂයේ සිට මඉඋකා පිරිවැටුමෙහි සහ වෙළඳපොළ කොටස්කාරිත්වයෙහි අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. LMD සඟරාව, රජය සතු ව්‍යවසාය සහ පෞද්ගලික සමාගම්වල කාලීන ව්‍යාපාර තොරතුරු, කළමනාකරණ අදහස් සහ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ප්‍රභවයක්ව පවතින ප්‍රමුඛ ව්‍යාපාර සඟරාවකි. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය පදනම් කර ගනිමින් බඑෘ සඟරාව විසින් රජය සතු සාර්ථක ව්‍යවසායන් 20ක් වාර්ෂිකව ලැයිස්තුගත කරනු ලැබේ. 2011/12 න් අවසන් වූ වර්ෂය සඳහා මඉඋකා හොඳම රජය සතු ව්‍යවසායන් 20 අතරින් 12 වැනි ස්ථානයට ලැයිස්තුගත කර ඇත

2011 වර්ෂයේදී පූර්ණ අයිතිය සතු පරිපාලිත සමාගමක් වන මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම (මඉසේස) පහිටුවමින් මඉඋකා ඔවුන්ගේ ඉදිකිරීම් ක්ෂේත්‍රය නව්‍යකරණයට කරන ලදී. වර්තමානයේදී මඉසේස, මඉඋකා හි ඉදිකිරීම් අංශය ලෙස ක්‍රියාත්මක වේ.

# 2015 වර්ෂයේ විශේෂතා

## 2015 වර්ෂය අවසානය දක්වා සාක්ෂාත් කර ගැනීම් - උපදේශන අංශය

| පැකේජය/විස්තරය | ව්‍යාපෘතියේ මුළු වටිනාකම - ශ්‍රීලරු | භෞතික ප්‍රගතිය % | සටහන් |
|---|---|---|---|
| නාගොඩ - නෑබොඩ සහ අවිත්තාව -ලෙවන්දූව මාර්ග<br>නාඋල-ඇළහැර-පල්ලෙගම-හෙට්ටිපොළ සහම හසලක - හඳුන්ගමුව මාර්ග<br>හපුතලේ - බොරලන්ද - කැප්පෙටිපොළ මාර්ගය<br>බෝද්‍ාගම-හම්බෙගමුව-කල්තොට මාර්ගය | 12,784,173,027.90 | 82 | ව්‍යාපෘතිය සිදු කරමින් පවතී |





දේශීය බැංකු අරමුදල් ලැබූ මාර්ල පුනරුත්ථාපන ව්‍යාපෘතිය

### දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම

පැකේජය/විස්තරය: මාතර සිට බෙලිඅත්ත සහ මත්තල සිට හම්බන්තොට

ව්‍යාපෘතියේ මුළු වටනාකම - ශ්‍රීලරු: 255,280,000,000.00

භෞතික ප්‍රගතිය %: 8.34

සටහන්: ව්‍යාපෘතිය සිදු කරමින් පවතී




### දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය



පැකේජය/විස්තරය: මාතර - බෙලිඅත්ත කොටස

ව්‍යාපෘතියේ මුළු වටනාකම - ශ්‍රීලරු: බිලියන 36

භෞතික ප්‍රගතිය %: 71% ක් සම්පූර්ණ කර ඇත

සටහන්: ව්‍යාපෘතිය සිදු කරමින් පවතී

### අකුරගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (ක්‍රියා)



ව්‍යාපෘතියේ මුළු වටනාකම - ශ්‍රීලරු: බිලියන 77

භෞතික ප්‍රගතිය %: 77 % ක් සම්පූර්ණ කර ඇත

සටහන්: ව්‍යාපෘතිය සිදු කරමින් පවතී. ඉංජිනේරු, ප්‍රමාණ සමීක්ෂණ සහ ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් ලබාදීමේ වගකීම දරනු ලබන්නේ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය විසිනි.

### ත්‍රිකුණාමලය නාවික තටාකාංගනයෙහි ජැටියක් නිර්මාණය කිරීම.

ව්‍යාපෘතියේ මුළු වටනාකම - ශ්‍රීලරු: මිලියන 1000

භෞතික ප්‍රගතිය %: 40% ක් සම්පූර්ණ කර ඇත

සටහන්: ව්‍යාපෘතිය සිදු කරමින් පවතී





### කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 12,723කි. 2015 වර්ෂය අවසානය වනවිට අත්පත් කරගෙන ඇති ප්‍රගතිය 15%කි.





## බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ සැලසුම් සමාලෝචන සහ ඉදිකිරීම් අධීක්ෂණ වගකීම මඉඋකා සතු වේ. මෙම ව්‍යාඵෘතියේ මුළු පිරිවැය රු.මිලියන 11,480කි. සාත්ෂාත් කරගත් ප්‍රගතිය 6%කි.



## කොළඹ 3, AVIC මහල් නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු


රු.බිලියන 25ක මෙම ව්‍යාපෘතියේ ලිපිලේඛන සමාලෝචනය කිරීම සඳහා සැලසුම් කාර්යාලයෙන් තාක්සණික සහාය ලබාදීම සහ නේවාසික අධීක්ෂණය සඳහා මඉඋකා වගකීම දරයි.සාක්ෂාත් කරගත් ප්‍රගතිය 25%කි. සේවාදායකයා ඇවික් හොටෙල්ස් ලංකා සමාගමයි.



## රත්මලාන, ගුවන් හමුදා කඳවුරෙහි පිහිනුම් තටාකයක් ඉදිකිරීම

පිහිනුම් තරඟ සහ වෝටර් පෝලෝ ක්‍රීඩා ඉසව් පැවැත්වීම අරමුණු කර ගනිමින් කිමිදුම් පහසුකම් සහිත මීටර් 50ක් දිග මීටර් 25ක් පළල (චැනල 10ක් සහිත) අන්තර්ජාතික මට්ටමේ පිහිනුම් තටාකයක් ඉදිකිරීම ව්‍යාපෘතියට අයත් වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 192කි. මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කර ඇත.





## 2015 වර්සයේ දෙසැම්බර් මාසය දක්වා සාක්ෂාත් කරගැනීම් - ඉදිකිරීම් අංශය

### හම්බන්තොට මහ රෝහල ඉදිකිරීම

පැකේජය/විස්තරය: මහල් 10කින් යුත් ඇඳන් 850ක රෝහලකි

ව්‍යාපෘතියේ මුළු වටනාකම - ශ්‍රීලරු: මිලියන 1, 654

භෞතික ප්‍රගතිය %: 95% ක් සම්පූර්ණ කර ඇත

සටහන්: ව්‍යාපෘතිය සිදු කරමින් පවතී



### රත්මලාන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය සඳහා ශාස්ත්‍රීය ගොඩනැගිලි ඉදිකිරීම

ව්‍යාපෘතියේ මුළු වටනාකම - ශ්‍රීලරු: මිලියන 690

භෞතික ප්‍රගතිය %: 100% ක් සම්පූර්ණ කර ඇත

සටහන්: ව්‍යාපෘතිය සිදු කරමින් පවතී



### කොළඹ, මහල් දහයකින් සමන්විත දන්තාරෝග්‍ය ශාලාවක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම

සාක්ෂාත් කරගෙන ඇති ප්‍රගතිය 99%. මුළු පිරිවැය රු.මිලියන 624.





### මොරාන ජලාශය ඉදිකිරීම

සාක්ෂාත් කර ගත් ප්‍රගතිය 31%කි. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 1008කි.



**රත්මලාන, ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයේ ප්‍රදේශීය සහාය මධ්‍යස්ථානය (බස්නාහිර-දකුණ) සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 338කි. මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇත



**බත්තරමුල්ල ජාතික පරිසර ලේකම් කාර්යාලය සැලසුම් කිරීම සහ ඉදිකිරීම - හරිත ගොඩනැගිලි ව්‍යාපෘතියකි**

බත්තරමුල්ල ජාතික පරිසර ලේකම් කාර්යාලය සැලසුම් කිරීම සහ ඉදිකිරීම - හරිත ගොඩනැගිලි ව්‍යාපෘතියකි





# මෑතකදී ලබාගත් සම්මාන

ආයතන සඳහා 2015 වර්ෂය සඳහා “ඉංජිනේරු විශිෂ්ටතා සම්මානය” - උපදේශන සේවාවන් සඳහා “ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය” විසින් පිරිනමන ලද කුසලතා සහතිකය



# ඉ.කා.පි.ම.උ.කා මූල්‍ය කාර්ය සාධනය


පසුගිය වර්ෂයේ මාඉඋකා හි සහ සමූහයෙහි මෙහෙයුම්වලින් ලත් ප්‍රතිප්‍රකාශිත බදු පෙර ලාභය වන පිළිවෙළින් රු.552,433,247 සහ 684,223,033 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී බදු පෙර ලාභය පිළිවෙළින් රු. 595,972,241 සහ 713,584,787ක් විය. සමූහය එහි ලාභය 4%කින් වැඩි කරගෙන ඇති අතර මඉඋකා හි ලාභය 7%කින් වැඩි වී ඇත.

1,347ක කාර්ය මණ්ඩල ශක්තිය සහ රු. මිලියන 16,607ක මුළු වත්කම් පරිභෝජනය කරමින් 2015 වර්ෂය තුළදී මාඉඋකා රු.මිලියන 595ක ශුද්ධ ලාභයක් උපයා ගන්නා ලදී. තවද, ලාභය එහි මුළු වත්කම්වලින් 4%ක් නියෝජනය කරනු ලබයි.

## ආදායම වෙනස් වීම




## ලාභය වෙනස් වීම



# ඉ.කා.පි.ම.උ.කා හි ගෝලීය සහ දේශීය රූපාකාරය


## ම.ඉ.උ.කා. ගෝලීය ව්‍යාපෘති




## ම.ඉ.උ.කා. ප්‍රාදේශීය හා ව්‍යාපෘති කාර්යාල

මූලස්ථාන කාර්යාල

ව්‍යාපෘති කාර්යාල



# විශේෂිත ක්ෂේත්‍ර සහ සේවාවන්



රෝහල් සංවර්ධන

ගෘහනිර්මාණාත්මක සේවාවන්

ව්‍යුහාත්මක සැලසුම්

ප්‍රමාණ සමීක්ෂණ

මාර්ග සහ පාලම්

දුම්රිය මාර්ග කාර්යයන්

වරාය/ වෙරළ කාර්යයන්

ගුවන්තොටුපළ සංවර්ධන

ජල සම්පාදන සහ ජලාපවාහන

ජල විදුලි සහ බලශක්ති

විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම

ජල සම්පත් සංවර්ධන

තාක්ෂණ විගණන / වේලි ආරක්ෂණ

විදුලි සහ යාන්ත්‍රික කාර්යයන්


ඉඩම් මැනීම්

තොරතුරු තාක්ෂණ (IT)


පාරිසරික අධ්‍යයන

ව්‍යාපෘති කළමනාකරණ

භූ-තාක්ෂණික විමර්ශන සහ පරීක්ෂණාගාර සේවාවන්











# මානව සම්පත්

## ඉ.කා.පි.ම.උ.කා මානව ප්‍රාග්ධනය


"කාර්යාංශය" ලෙසද හැඳුන්වන මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (මඉඋකා), එහි සේවකයින් සඳහා වටිනාකම් නිර්මාණය කරන්නේ ප්‍රධාන වශයෙන් "තමන් වර්ධනය" කිරීමට උනන්දු වූ පුද්ගලයින් සමඟ උද්වේගකර වූ කණ්ඩායම්වල කොටසක් ලෙස අසමසම රැකියා ස්ථානයක් ලබා දීමෙනි. සිය මානව සම්පත් ප්‍රාග්ධනය එහි වඩාත්ම වටිනා සම්පත බව මඉඋකා සැම විටම හඳුනාගෙන ඇති අතර එය එහි මානව සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන ඉදිකිරීම් කර්මාන්තයේ විවිධාකාර ස්වභාවය හා ඉල්ලුම නොතකා එය සහතික කිරීම සඳහා කටයුතු කර ඇත, සේවක ඵලදායිතා අභිමතාර්ථ සහ එහි ශ්‍රම බලකාය සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා පරිපාලන ව්‍යුහයන්, ක්‍රමවේදයන් සහ ක්‍රියාපටිපාටි සකස් කර ඇත.

## අපගේ මානව සම්පත් ශ්‍රම බලකාය

ප්‍රතිපත්ති රාමුවෙහි සහ ප්‍රතිපත්ති යොදා ගැනීමේ සමානාත්මතාවය සහතික කිරීම සඳහා මඉඋකා තුළ සියළු මානව සම්පත් ක්‍රියාකාරකම්, ආයතනයේ මානව සම්පත් ඒකකය විසින් කේන්ද්‍රීයව සම්බන්ධීකරණය කරනු ලැබේ.

ECB හි වෘත්තීය හා වෙනත් සේවක සංඛ්‍යාව 1,073 ක් වන අතර සෑම මූලික කාර්යාලයම සේවක සංවර්ධනය හා රඳවා තබා ගැනීමේ විශිෂ්ට මට්ටමක් පෙන්නුම් කරයි; කාර්යාංශයේ පුළුල් මානව සම්පත් ප්‍රතිපත්තියේ සාර්ථකත්වය සඳහා සාක්ෂි ලෙස ඉදිරිපත් කරනු ලබන කරුණු. පහත දැක්වෙන වෘත්තීන් හා විශේෂඥතාවන්හි නිරතව සිටින සේවකයින්ගෙන් බහුතරය පිරිමි (76%) වන අතර 26% ක් කාන්තාවන් වේ.

- සිවිල් /යාන්ත්‍රික /විදුලි/පාරිසරික /පද්ධති ඉංජිනේරු ආදී..
- ගෘහ නිර්මාණ ශිල්පී
- ප්‍රමාණ සමීක්ෂකයන්
- IT වෘත්තිකයන්
- නීති වෘත්තිකයන්
- මානව සම්පත් වෘත්තිනයන්
- ගණකාධිකාරිවරුන්
- තාක්ෂණ සහ තාක්ෂණ නොවන සහකරුවන්
- සැලසුම් ශිල්පීන්




## බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය

උසස්වීම්, වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ සහ ශක්තිමත් පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා ඇති අවස්ථා සහ වර්ධනය වීම සඳහා ලබා ගත හැකි බොහෝ අවස්ථාවන් හේතුවෙන් මඉඋකා වෘත්තීන් ආරම්භ කිරීම සඳහා ඉතා විශිෂ්ට ස්ථානයක් ලෙස මඉඋකා දීර්ඝ කාලයක සිට පිළිගැනීමට ලක්ව ඇත. අපගේ ව්‍යාපාර අවශ්‍යතා සඳහා තරුණ සුදුසුකම් ලත් වෘත්තිකයින් සහ අතිකුත් මට්ටම්වල කාර්යමණ්ඩලය බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන අතර කැපී පෙනෙන කාර්ය සාධනයක් වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණුවක් ලබා දෙන බවට වග බලා ගැනීම සිදු කරයි.

සියලුම බඳවා ගැනීම්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කරමින් සිදු කරන අතර සියලුම සේවකයන් ,ප්‍රාථමික, කළමනාකරණ සහකාර, කණිෂ්ඨ කළමනාකරු, මධ්‍යම කළමණාකරු සහ උසස් කළමනාකරු යනුවෙන් මට්ටම් පහකට කාණ්ඩගත කර ඇත.

## මානව සම්පත් ප්‍රතිපත්තිය

මානව සම්පත් ඒකකය, සාමාන්‍යාධිකාරිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතින අතර, කාර්යාංශයේ සිදු කරනු ලබන සියලුම මානව සම්පත් ක්‍රියාකාරකම්වල වගකීම දරයි. නිරන්තර අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් මගින් සහතික කර ඇති සම්මුතීන් මඟින් සේවක වෘත්තිමය සංවර්ධනය, ආරක්ෂාව සහ අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලැබේ. රජය විසින් සකස් කර ඇති ක්‍රියා පටිපාටිවලට අනුකූලව විධිමත් ප්‍රතිපත්ති රාමු සකස් කර ඇති අතර බඳවා ගැනීම, රජයේ මාර්ගෝපදේශවලින් ලබා දෙන ණාජෂ පදනම් කර ගනිමින් කාර්ය සාධනය ඇගයීම, දුක් ගැනවිලි හැසිරවීම, පුහුණුව සහ සංවර්ධනය හා වන්දි ලබා දීම ආවරණය වේ.

## පුහුණුව සහ සංවර්ධනය

සියළුම වර්ගයේ සේවකයින් සඳහා අදාළ පුහුණු හා සංවර්ධන අවස්ථා ලබා දීමට මඉලකා නිරතුරුවම කැප වී සිටී. නව දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම තුළින් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීම සඳහා සහාය වීම මඟින් පුහුණුව හා සංවර්ධනය මානව සම්පත් පුහුණු කිරීම උදෙසා වන කාර්යාංශයේ විධිමත් ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් කරනු ලබන අතර ඔවුන්ගේ වැඩිදියුණුව අනෙක් අතට ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කාර්යාංශයේ කාර්ය සාධනය සහ කීර්ති නාමය තවදුරටත් ඉහළ නංවනු ඇත.

ඉහත සඳහන් වැදගත් අභිලාෂයන් සපුරාලීම සඳහා මඉලකා විසින් එහි සේවකයන් සඳහා  දර්ශනපති සහ පශ්චාත් උපාධි, විදේශ පුහුණුවීම්, ඩිප්ලෝමා, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා, සහතික පත්‍ර පාඨමාල, දේශන/ සම්මන්ත්‍රණ, වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා, වෘත්තිමය සමාලෝචන, මඉලකා පුහුණු අංශය විසින් සංවිධානය කරන ලද අභ්‍යන්තර දැනුම හුවමාරු වැඩසටහන් (ඉදිරිපත් කිරීම්) සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් වැනි විවිධ වැඩසහන්වලට සහභාගීවීමේ අවස්ථාවන් ලබා දේ.

පුහුණු ඒකකයේ නිරන්තර සමීක්ෂණ සිදු කර අධ්‍යයන පාඨමාලා සහ පර්යේෂණ, සම්මන්ත්‍රණ, ඉදිරිපත් කිරීම් සහ වැඩමුළු ආදි වශයෙන් වන පවතින බාහිර හා අභ්‍යන්තර පුහුණු අවස්ථා හඳුනාගනී. පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය මත පදනම්ව, පුහුණු අංශය විසින් එවැනි බාහිර/අභ්‍යන්තර පුහුණු සඳහා සේවකයන් යොමු කිරීම සිදු කරනු ලැබේ. මඉලකා දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද සිය වෘත්තීය කාර්ය මණ්ඩලයට පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ කෙටි පාඨමාලා, සහතිකපත් ලබා ගැනීම සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබා දෙමින් පහසුකම් සැපයීම සිදු කරයි.

## සේවක බැඳීම

මඉලකා හි සේවකයින් විසින් සංවිධානය කරනු ලබන සමාජ ක්‍රියාකාරකම් සඳහා කාර්යාංශය මූල්‍ය දායකත්වය සපයයි. එබැවින් කාර්යාංශයේ සේවකයන්ගේ සහභාගිත්වයෙන් ආගමික කටයුතු, ක්‍රීඩා ක්‍රියාකාරකම්, විනෝදාත්මක සහ සුභසාධන කටයුතු ආදි ක්‍රියාකාරකම ප්‍රධාන කාර්යාලයේ මෙන්ම මූලික කාර්යාලවලද පැවැත්වේ. කාර්යාංශයේ සේවකයින්ට සංගම් පිහිටුවා ගැනීමේ නිදහස ඇති අතර, එබැවින් ඔවුන්ගේ රැකියාව හා සුභසාධනය සම්බන්ධ කාරණාවලදී තම සාමාජිකයන් නියෝජනය කරනු ලබන ක්‍රියාකාරි වෘත්තීය සමිති සහ සුභසාධක සමිතිය බොහොමයක් ඇත.

## සේවක ප්‍රතිලාභ

රෝහල්ගතවීම ආවරණය කිරීම, ලබා නොගත් වෛද්‍ය නිවාඩු ප්‍රතිපූරණය කිරීම, ව්‍යවස්ථාපිත මාතෘ නිවාඩු, විශේෂඥ ගාස්තු ප්‍රතිපූරණය, මරණ පාරිතෝෂි ආදියෙන් සමන්විත වන වෛද්‍ය රක්ෂණයක් ඇතුලත් වඩාත් හොඳ ප්‍රතිලාභ පැකේජයක් මඉලකා හි සියලු සේවකයන් සඳහා කාර්යාංශය විසින් ලබා දෙයි. ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වයට අනිවාර්යයෙන්ම සේවකයන් බඳවා ගැනේ. පාරිතෝෂික ගෙවීම් සඳහා මෙන්ම කාර්ය සාධනය පදනම් කරගත් වාර්ෂික ප්‍රසාද දීමනා සඳහාද සේවකයන්ට හිමිකමක් පවතී.



# මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම

## දැක්ම

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ අද්විතීය ආදර්ශයක් වීම.

## මෙහෙවර

දායකත්වය ප්‍රමාණවත් ලෙස හඳුනාගන්නා ලද ඉහළ අභිප්‍රේරණයක් සහ පුහුණුවක් සහිත කාර්යමණ්ඩලයක් සමඟින් ඉදිකිරීම් තාක්ෂණයේ විශිෂ්ටත්වය අත්පත් කර ගැනීම සහ නවෝත්පාදනයක් ලබා ගැනීම

මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම (මඉසේස) මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (මඉඋකා) ට පූර්ණ වශයෙන් අයත් අනුබද්ධිත ආයතනයක් වන අතර 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2003 වර්ෂයේ දෙසැම්බර් මස 16 වැනි දින සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2009 වර්ෂයේ නොවැම්බර් මස නැවත ලියාපදිංචි කර ඇත.

මෙම කාලපරිච්ඡේදයේදී ඇති වූ විශාල පිබිදීමේ ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම් සේවාවන් සඳහා වූ අධික ඉල්ලුම මඟින් ඇති කරන ලද අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් 2011 වර්ෂය ආරම්භයේදී මඉසේස ඉදිකිරීම් කර්මාන්තයේ ක්‍රියාකාරීව මෙහෙයුම් ආරම්භ කරන ලදී. මඉඋකා සමඟ එක්ව කටයුතු කිරීම තුළින් ඉදිකිරීම් කළමනාකරණ සහ තාක්ෂණික දැනුම මෙන්ම එහි ව්‍යාපෘති කළමනාකරණ දැනුම් හැකියාවද ලබා ගනිමින් කර්මාන්තය විසින් පිරිනමන ලද අභියෝගය මඉසේස විසින් භාර ගන්නා ලදී.

මඉසේසහි ප්‍රධාන ව්‍යාපාර වන්නේ ගොඩනැගිලි, මාර්ග, පාලම්, ජල සම්පාදන ව්‍යුහ ඉදිකිරීම සහ වෙනත් සේවා ක්ෂේත්‍ර වේ. සමාගම, එහි ව්‍යාපෘති සඳහා කොන්ක්‍රීට් සහ ඇස්ෆාල්ට් නිෂ්පාදනය කිරීමේද යෙදී සිටී.

මඉසේස රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශ සේවාදයකයන් සඳහාද සේවා සපයයි. සියලු ආකාරයේ ආයතනික ඉදිකිරීම් ව්‍යාපෘති නියමිත කාලයට සම්පූර්ණ කිරීම හේතුවෙන් මඉසේස රාජ්‍ය ආයතන, ව්‍යාපාරික ප්‍රමුඛයන් සහ පරිපාලකයින් සිය ගණනකගේ විශ්වාසය දිනාගෙන ඇත. මඉඋකා 1973 වැනි ඈත කාලයකදී උපදේශකවරුන් ලෙස මුලින්ම කර්මාන්තයට පිවිසීම තුළින් වර්තමානයේදී අභිප්‍රේරණයේ ප්‍රභවයක් ලෙස ක්‍රියා කරන බොහෝ අත්දැකීම් ලබා ඇත. තවද මඉඋකා සෙවනෙහි ඉදිකිරීම් අත්දැකීම් මඟින් තිරසාර ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කරයි

# අධ්‍යක්ෂ මණ්ඩලය



**ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා**
**සභාපති**

B.Sc.(Eng), PG Dip (Const.Mgt),
PG Dip (Ports & Coastal) Norway, MIE(SL), C.Eng, MASCE



**ඉංජි. එන්. රූපසිංහ මහතා**
**අධ්‍යක්ෂ**

BSc.Eng (Hons)., PG.Dip (Hydropower) Norway.,
C Eng., MIE(SL)., MICE (UK)., Ltd Surveyor



**ඉංජි. එම්.ආර්.පී. රණතුංග මහතා**
**අධ්‍යක්ෂ**

LLB (Sri Lanka), Attorney-at-Law, Notary Public.,
Actg. Magistrate



**ඉංජි. කේ.එල්.එස්. සහබන්දු මහතා**
**අධ්‍යක්ෂ**

BSc.Eng (Hons), PG Dip (Hyd), MSc.(Struct.), CEng, MICE (London),MIE(SL),
M.Cons E(SL), FSSE (SL)



**එස්.එම්.එන්.එල්. සේනානායක මහතා**
**අධ්‍යක්ෂ**

BSc. Dip Mgt, FCA



**ඉංජි. එස්.පී.පී. නානායක්කාර මහතා**
**අධ්‍යක්ෂ / ප්‍රවීනි**

Bsc.Eng, C Eng, MICE (UK), MIE (SL)



**ඉංජි. ටී.ඩී. වික්‍රමරත්න මහතා**
**අධ්‍යක්ෂ**

BSc.Eng (Hons), M. Eng. PG. Dip. (Hydrology), MICE (UK), FIE (SL),
C Eng



**ඉංජි. ඒ. ගල්කැටිය මහතා**
**අධ්‍යක්ෂ**

BSc.Eng, C Eng, MIE (SL)



**යූ.එන්.බී. මාවතගම මහතා**
**අධ්‍යක්ෂ**

CBA (ICASL), Dip in Acct, SAT


# මඉසේස විසින් නිම කරන ලද ව්‍යාපෘති සමහරක්



කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යායේ පිහිටි උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල



උතුරු පළාතේ පිහිටි ලංකා විදුලිබල මණ්ඩල ගොඩනැගිල්ල



මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණය



හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල


යාපනය පොලිස් ස්ථානය



බැද්දගාන තෙත්බිම් උද්‍යානය


පින්නවල සත්ත්ව උද්‍යානයේ කිඹුලන් සඳහා වූ කුටිය



පේදුරු තුඩුව පොලිස් ස්ථානය


පොලොන්නරුව මහ රෝහලේ වාට්ටු සංකීර්ණය


රඹාවැව වැලිඔය - තඹලගොල්ලෑව මාර්ගය